වර්ෂ 2025 ක් වූ සැප්තැම්බර් මස 09 වන දින පෙ.ව. 10.00ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද

<u>මතුගම ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව</u>

**සහභාගිත්වය -:ගරු සභිකවරු**

01. කසුන් මුණසිංහ මහතා - ගරු සභාපති
02. අනගිපුර සමන්ත රෝහණ මහතා - ගරු උප සභාපති
03. ලෙව්වන්දූව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
09. සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. ඩබ්.කේ. සුනෙත් ප්‍රියංකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. රසික දුලන්ත වික්‍රමනායක මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. විතානගේ දොන් නිශාන්ත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
14. බී.ඒ. අමිල ගයාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
15. පී.ඩී. අමන් ප්‍රසාද් වික්‍රමසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
17. එම්. ජගත් විමලසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. ලියනගුරුගේ ලාල් රංජිත් සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
19. ඒ. සුජිත් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
20. ගංවාරි සනත් සංජීව මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. ඩී. අනූෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
23. මාවතගේ ගාමිණී සිසිර කුලරත්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
24. ඩී.ඩබ්. උභයනන්ද පද්මලාල් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
25. කළුගල හේවාගේ ගාමිණී මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
26. තොටගමගේ නිහාල් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
27. ටී. විජිතා දර්ශනී කුමාරි ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
28. කේ.ඒ.ඩී. තිළිණි මධුෂානි සිරිවර්ධන මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
29. කේ.කේ. කාවින්ද්‍යා ඉඳුවරනි මෙනවිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
30. චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
31. ආර්.එම්. රුවන්ති වාසනා රත්නායක මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
32. ඩබ්.ඒ. ඕෂධි ධනංජනා මෙනවිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
33. දොන් සීමන් රාලලාගේ දුමිඳු චතුර සම්පත් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**නිලධාරින්**

01 නෙලු නිශාන්ති ඉද්දගොඩ මහත්මිය - ලේකම්

02 ඩබ්.ඩබ්.ජී.එල්. ප්‍රනාන්දු මහත්මිය - කළමනාකරණ සේවා නිලධාරි (සභා)

ආගම සිහිකිරිම

(අ) පසුගිය සභාවේ රැස්වීම් වාර්තාව සම්මත කිරිම

- 2025.08.12 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිමට ඉදිරිපත් කරමි.

  2025.08.12 වන දින මහ සභා රැස්වීම් වාර්තාව **ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා** විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව පහත සංශෝධන වලට යටත්ව එකමතිකව සභා සම්මත කරන ලදී .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

2025.08.12 සභා වාර්තාවේ 19 වන පිටුවේ 5වන පේලියේ **නැත්නම්** යන්නට **අපගේ කණ්ඩායමේ විරෝධතාවය සහිතව සටහන් කරගෙන** ලෙස සංශෝධනය විය යුතු බව පවසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

බස්නාහිර පළාත් සභාවේ ජේ.සි.බී. යන්ත්‍රය සඳහා මේ විමර්ශනය කටයුතු සිදුවෙමින් පවතින්නේ කුමන තැනද අරගෙන තියෙන ඊළඟ පියවර කුමක්ද කියන තැන තමයි අපි අපේ එකඟතාවය පල කරන්නේ අන්න ඒ මත මෙය අළුත්වැඩියා කිරිමට අපගේ විරෝධතාවයක් නැහැ.

ඉහත සංශෝධනයන්ට යටත්ව 2025.08.12 වන දින සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන - නැත

(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා - නැත

(ඈ) සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරිම

ඈ-1 **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ඈ-1.1 පී.ඩී. ජයසූරිය මයා, පන්සල පාර, කොටගෙදර, නවුත්තුඩුව විසින් ඉදිරිපත් කර ඇති අංක 178 කොටගෙදර ග්‍රාම නිලධාරි වසමේ කොන්ඩගලහේන රජයේ ඉඩම තුළ පමණක් අසම්පුර්ණ පාරක් කපා මා හට හා මාගේ සින්නක්කර ඉඩමට ගැටළු ඇති කිරිම හා එම පාර ප්‍රධාන පාරට සම්බන්ද නොකිරිම සම්බන්ධ ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී

ඈ-1.2 ප්‍රධාන සංඝනායක මහෝපාද්‍යා යටදොලවත්තේ චන්ද්‍රසිරි ස්ථවිරයන් විසින් ඉදිරිපත් කර ඇති යටදොලවත්තේ ආරම්භ කිරිමට අනුමත සුරාසැල සම්බන්ධ ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී

ඈ-1.3 පී.එල්. ඉනෝකා ප්‍රියදර්ශනි , මාවතගොඩ, හොරවල, වැලිපැන්න විසින් ඉදිරිපත් කර ඇති ඉඩම් කැබැල්ලක් ලබා ගැනිම සම්බන්ධ ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී

ඈ-1.4 අයි.කේ. සිරිසේන, නිවිතිගල කැලේ පාර, මතුගම විසින් ඉදිරිපත් කර ඇති අලුතින් විදුලි ලාම්පුවක් සවිකර ගැනිම සඳහා ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී

ඈ-2 **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

ඈ-2.1 පී.ඩී. ජයසූරිය මයා, පන්සල පාර, කොටගෙදර, නවුත්තුඩුව විසින් ඉදිරිපත් කර ඇති අංක 178 කොටගෙදර ග්‍රාම නිලධාරි වසමේ කොන්ඩගලහේන රජයේ ඉඩම තුළ පමණක් අසම්පුර්ණ පාරක් කපා මා හට හා මාගේ සින්නක්කර ඉඩමට ගැටළු ඇති කිරිම හා එම පාර ප්‍රධාන පාරට සම්බන්ද නොකිරිම සම්බන්ධ ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී

ඇ-3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජීත් කුමාර මහතා

ඇ-3.1 ටෙක්ස්පේස් පුද්ගලික සමාගම, වැලිපැන්න ශාඛාව විසින් ඉදිරිපත් කර ඇති අබලි ද්‍රව්‍ය බැහැර කිරිම සම්බන්ධ ලිපය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා

**ඊ-01. ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-1.1 අප ප්‍රාදේශිය සභාවේ සේවයේ නියළුන හා නියලෙන සේවක සේවිකාවන්ගේ මියයාමකදී ආදාහනාගාරය භාවිතා කරන්නේනම් එම සේවක සේවිකාවන්ට කෙරෙන අවසන් ගෞරවයක් වශයෙන් එය නොමිලේ ලබා දීමට කටයුතු සලසන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතා**

මෙම යෝජනාව හොද තීරණයක් ලෙස මම දකිනවා. මේ සඳහා මම අදහසක් එකතු කරනවා හිටපු මන්ත්‍රීවරුන්ටත් මෙය ගෞරවයක් ලෙස ලබා දිමට හැකියාවක් තිබෙනවා නම් ලෙස අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙම යෝජනාව සම්බන්ධව අපි එකඟ නැහැ. මොකද මේ සභාව ආර්ථික අර්බුදයක් තියෙන සභාවක් දැනටත් මුදල් හොයා ගන්නේ හරිම අමාරුවෙන්. මතුගම බල ප්‍රදේශයේ ජනතාව සඳහා ආදාහනාගාර ගාස්තුව පොදුවේ අඩුකරන්න පුළුවන් නම් අඩුකරන්න නැත්නම් මෙම යෝජනාව කාලින යෝජනාවක් නොවන බව පවසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

දැනට සේවයේ යෙදි සිටින සේවකයෙක් විශ්‍රාම ගියත් ඒ සේවකයාට ඒ අවස්ථාව ලබාදෙන්න කියන එකයි ලෙස පැහැදිලි කරන ලදී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

මෙම යෝජනාව ඉතාම හොඳ යෝජනාවක් සහ කාලින යෝජනාවක් බව පවසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

මතුගම ප්‍රාදේශීය සභාවේ කියන වචනය පාවිච්චි කිරිම අසාධාරණයි. බල ප්‍රදේශයේ ම ජනතාව වෙනුවෙන් ආදාහනාගාර මුදල අඩු කරලා මුළු මහත් ජනතාවට භුක්තිවිදිමට ඒ අවස්ථාව ලබා දෙන ලෙස අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මේ යෝජනාව සම්බන්ධයෙන් මම මේ අවස්ථාවේ දැනගන්න කැමතියි ලලිත් සිරිවර්ධන මහතා අපගේ කියලා අදහසක් දැක්වුවා. ඒ සඳහා සියළු දෙනාම ඇතුලත් වෙනවාද යන්න දැනගන්න කැමති බව පවසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

හැමෝටම ස්වාධින අදහස් තියෙනවා. ඒ නිසා ඒ අවස්ථාවේදී ඒ අය අදහස් දක්වයි. මම අපගේ කියලා කිව්වේ ජාතික ජන බලවේගයට තමයි. අපගේ මන්ත්‍රීවරුන්ගේ අදහස වෙන වෙනමත් ගන්න පුළුවන් බව පවසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මෙම පස්දුන් කෝරලයේ අගනගරය තමයි මේ ආදර්ශමත් සභාවක් බිහිකිරීමට තමයි අපේ අරමුණ ආදර්ශමත් යෝජනාවක් තමයි මේ ගෙනැල්ලා තියෙන්නේ. අපි නියෝජනය කරන පොදුවේ සියළුම මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත ප්‍රකාශ කර සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මුදල අඩු කරන්න පුළුවන්කමක් නැහැ. මේ අය වෙනුවෙන් ගෞරවයක් දැක්වීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවක් බව පැහැදිලි කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වයේ මාලිමාවේ කණ්ඩායමක් ලෙස මගේ අදහස දැක්වුවත්, අපි කියන වචනය භාවිතා කරන්නත් අපේ මන්ත්‍රීවරුන්ට තනි තනියෙන් අදහස් දක්වන්න අවස්ථාව තියෙනවා. නමුත් මම විශ්වාස කරනවා අවසානයේ මම විශ්වාස කරවා අවසානයේ මම දරණ මතයේ ඉන්නවා කියන එක. මේ සභාවේ ආර්ථික මට්ටමින් පහල මට්ටමේ ඉන්න සෞඛ්‍ය කම්කරුවට මාර්ග කම්කරුවට දුන්නට අපගේ විරුද්ධත්වයක් නැහැ. ඔබතුමාගේ යෝජනාවේ තියෙන දේට විරුද්ධ වුණා මිසක් ඔබතුමා මෙම යෝජනාව සංශෝධනයක් වෙනවා නම් ඒක ප්‍රශ්නයක් නැහැ. සෞඛ්‍ය කම්කරුවට මාර්ග කම්කරුවට යම්කිසි සහනයක් සලසනවා නම් අපි මාලිමාව විරුද්ධ නැහැ. මෙහි සිටින හැමෝටම මේ වරප්‍රසාදය ගන්න දෙනවා නම් අපි ඒකට එකඟ නොවන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සෞඛ්‍ය හා මාර්ග අංශයේ සේවකයින් සම්බන්ධයෙන් ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව අවධානයෙන් ඉන්නේ යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

මෙහි සේවය කරන සේවකයින් සහ නිලධාරින් දැන් ලබන වැටුප් විශ්‍රාම යාමෙන් පසුව ලැබෙන්නේ නැහැ. එම නිසා සභාවේ සේවය කරන සියළුම නිලධාරින් මෙයට ඇතුලත් කරනවාට අපි එකඟයි. බේදීමක් යටතේ මෙම යෝජනාව සම්මත කරන ලෙස අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා**

මම කියන්නේ මෙය සේවක විරෝධි අදහසක් නෙමෙයි. නමුත් හැගීම්බරව කරන යෝජනා නෙමෙයි මේවා විද්‍යාත්මකව කරන්න ඕන දේවල්. සේවකයින්ට වරප්‍රසාද දෙන්න ඕන, අයිතිවාසිකම් දෙන්න ඕන. ආදායම් උපයන්න ඕන ඉන් අනතුරුව සාධාරණව බෙදියන විදියහට කටයුතු කලයුතු බව අදහස් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා**

පුද්ගලික අංශය හෝ රාජ්‍ය ආයතනයක සේවකයින් තෘප්තිමත් නම් තමයි ඒ ආයතනය දියුණු වන්නේ. මෙම යෝජනාව ඉදිරිපත් කරන්න ඇත්තේ සේවකයින්ට ගෞරවයක් හැටියට. එම නිසා මම හිතනවා ආදාහනාගාරය නොමිලේ ලබා දීම සුදුසු බව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනෙත් ප්‍රියංකර මහතා**

මතුගම ප්‍රාදේශීය සභාව ගත්තාම දිලිදු පවුල් ඕන තරම් ඉන්නවා. ඒ නිසා අපිට පුද්ගලයින් වෙන් කරලා සුබසාධන කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ. ප්‍රාදේශීය සභාවේ තියෙන්නේ පොදු අරමුදලක් තියෙන්නේ ප්‍රාදේශීය සභා අරමුදල. ඒ අරමුදලින් වෙන වෙනම කරනවට මම පෞද්ගලිකව විරුද්ධයි. මේ අවුරුදු 04 කාල සීමාව තුළ අපි සුබසාධන අරමුදලක් එකතු කරලා ඒ මුදල් වලින් මේ සුබසාධන කටයුතු කරමුයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.ආර්. චතුර සම්පත් මහතා**

ගම්වල ඉන්න අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් ග්‍රාම නිලධාරී වාර්තාවක් අනුව ඔවුන්ට සහනයක් සලසන්න ඒ කියන්නේ සහනදායි මුදලකට ලබාදිමට හැකියාවක් ඇද්දැයි අදහස් විමසන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

මේ යෝජනාව සම්බන්ධයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කලේ ලාභ පාඩු සම්බන්ධයෙන් නොවේ. මෙය වැරදි ආදර්ශයක් බවට පත්වෙනවා. මතුගම ප්‍රාදේශීය සභාව මගින් ගන්නා සියළුම සුබසාධන හෝ වරප්‍රසාද මේ මතුගම ප්‍රාදේශීය සභාවේ ජනතාව වෙත ලැබිය යුතුයි යන්න අදහස් දක්වන ලදී

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ යෝජනාව ඉදිරිපත් කිරිමට හේතුව රාජ්‍ය සේවකයා වෙනුවෙන් ගෞරවයක් දැක්විම සඳහා මිසක. අපට පාඩුවක් ලබන්නද ලාබයක් ලබන්නද යෝජනාව ඇතුලේ කිර්තියක් ලබන්නද කියන දේ නෙමෙයි. නිලධාරින් අවු. 5 මාරුවෙලා යන්න පුළුවන් සේවකයින් මාරුවෙලා යන්නේ නැහැ එම නිසා මේ අය වෙනුවෙන් ගෞරවයක් හැටියටයි යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

සේවක සේවිකාවන් සහ සියළුම නිලධාරින් මෙයට අද සිට ඉදිරියට අයිතිනම් මේ සභාව නියෝජනනය කරන මන්ත්‍රීවරුවත් ඇතුලත් කරන්න යැයි මම අදහසක් හැටියට ඉදිරිපත් කරනවා. එහෙම නැත්නම් මම සංශෝධනයක් ගේනවා මෙන්න මේ විදිහට මෙහි සේවය කරන සේවක සේවිකාවන් විශ්‍රාම ගියායින් පසුව නෙමෙයි සේවය කරන කාලය තුළ යම්කිසි අභාවයක් වුනොත් නොමිලේ කටයුතු කරන්න යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් මොහොමඩ් රම්සාන් මහතා**

මෙම යෝජනා සම්මත කරගෙන ඉදිරියට ආදායම් වැඩිකර ගැනිමට කටයුතු කළායින් පස්සේ මේ පහසුකම් දෙන එක ගැටළුවක් නොවන බව අදහස් දක්වන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. උභයනන්ද පද්මලාල් මහතා**

මෙම යෝජනාව ඉදිරිපත් කරන්න ඇත්තේ මානව හිතවාදය මුල්කරගෙන වෙන්න ඕන. මරණයට වඩා ජීවිතයයි වැදගත් වන්නේ. කම්කරුවන් සඳහා වෘත්තිමය වටිනාකමක් දෙන්න ඕන. මරණය වටිනාකමට වඩා ජීවත්විමේ වටිනාකම ලබා දියයුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

***ගරු සභාපති කසුන් මුණසිංහ මහතාගේ ඊ-1.1 යෝජනාව පහත පරිදි සංශෝධනය කරන බව ප්‍රකාශ කරන ලදී.***

අප මතුගම ප්‍රාදේශිය සභාවේ සේවයේ යෙදි සිටින කාල සීමාව තුළ නිලධාරින් හා සේවක සේවිකාවන්ගේ මියයාමකදී ආදාහනාගාරය භාවිතා කරන්නේනම් එම සේවක සේවිකාවන්ට කෙරෙන අවසන් ගෞරවයක් වශයෙන් එය නොමිලේ ලබා දීමට කටයුතු සලසන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම සංශෝධන යෝජනාව ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහන මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව සංශෝධනයන්ට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.2 දීර්ඝ කාලයක් පුරාවට අප සමග ජීවත් වන වතු කම්කරු ජනතාව (දමිල ජනතාව) මුහුණපාන ප්‍රධාන ගැටළුවක් වන වතු නිවාස ගැටළුවට ස්ථිර විසඳුමකට යාම සඳහා වැඩපිළිවෙලක් සැකසීම හා එම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමට අවශ්‍ය ආයතන හඳුනාගෙන ඒ අය සමග සාකච්ඡා කර ස්ථිර විසඳුමක් ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මෙනවිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මෙනවිය**

වතුකර ජනතාව ඉතා දුශ්කර ජීවිතයක් ගත කරනවා ඔවුන්ට කිසිම පහසුකමක් නැහැ. ඔවුන් වෙනුවෙන් කතා කරන්න කාලෝචිත යෝජනාවක් බව අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

වතු සමාගම් විසින් කිසිම පහසුකමක් සලසා ගන්න අවස්ථාව ලබා දෙන්නේ නැහැ. වැසිකිළි පහසුකම් සළසා ගන්න දෙන්නේ නැහැ, ගෙවල් හදාන්න දෙන්නේ නැහැ. මේ ජනතාව වෙනුවෙන් සහනයක් සලසා දෙන්න අප කටයුතු කරන්න ඕන. ආණ්ඩුව විසින් ජනාධිපතිතුමා ගත්තා තීරණයක් වැවිලි කටයුතු අමාත්‍යාංශය දැනුවත් කළා. අවශ්‍යතාවය අනුව හදුනාගෙන ප්‍රාදේශීය ලේකම්තුමාගේ මැදිහත්වීම මත මෙම අවශ්‍යතාවය සලසා දිය යුතු බව අදහස් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙම යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක්. මේ වන විට වෝගන් වත්තේ ගෙවල් 29ක් හදන්න ඉන්නවා. යටදොලවත්ත ජන උදාන ගම්මානය ලක්ෂ 70ක ජලය ලබාදීමට කටයුතු කරලා තියෙනවා. අද ආරම්භ කරන ලක්ෂ 15 රන්නගල ඇල්ල ඉස්සරහින් යන මාර්ගය, වත්තටට යන පාර සඳහා ලක්ෂ 57ක් එන්න තියෙනවා. වතුකර ජනතාව වෙනුවෙන් වැඩ වැඩියෙන් කටයුතු කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. මොකද අපේ රටට ඩොලර් ගෙනාවේ ඒ අය. මේ යෝජනාව හොඳ යෝජනාවක්. අපිත් රජයක් හැටියට උපරිම සහයෝගය දෙනවා, සාකච්ඡා සංවිධානය කරන්න. අපේ පැත්තෙන් කරන්න පුළුවන් සහයෝගය ලබා දෙනවා. විශේෂයෙන්ම මතුගම ප්‍රාදේශීය සභාව මුල් කරගෙන දමිල ජනතාව සහ රටේ ඕනෑම ජීවත්වෙන වතුකර ජනතාව වෙනුවෙන් සුභසිද්ධිය සඳහා කරන කර්තව්‍යයට කණ්ඩායමක් හැටියටට අපි මාලිමාව ඕනෑම අවස්ථාවක සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

දෙමළ ජනතාවගේ සංවර්ධනය වෙනුවෙන් මේ ආණ්ඩුව කටයුතු කරනවා නම්, මෙම යෝජනාව ඉතා හොඳ යෝජනාවක්, ආයතන මට්ටමින් ඔවුන්ට පර්. 10ක් හෝ ලබාදීම සඳහා මේ සම්බන්ධයෙන් පියවර ගන්නවා නම් මේ සඳහා අපගේ සම්පූර්ණ සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කරන ලදී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා**

මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමේදී කියන්න කැමතියි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වතු ජනතාවගේ තොරතුරු ගිය සතියේ ලබාගෙන තියෙනවා යන්න අදහස් දක්වන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

වතුකර ජනතාව වෙත ඔවුන්ගේ නිවෙස් වලට යාම හරියට පාරක් නැහැ. මේවා රජයේ ඉඩම් බදු පදනම මත තමයි පෞද්ගලික ආයතන වෙත ලබාදිලා තියෙන්නේ බලයලත් නිලධාරින් කැඳවලා ඒ පදිංචි වෙලා ඉන්න අයගේ යෝජනා ගෙනැල්ලා ඔවුන්ගේ යෝජනා පිළිබඳව සලකා බලා එය ක්‍රියාත්මක කිරිම සිදු කරන්න යැයි ඉල්ලා සිටිමින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙනබව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය**

මතුගම වත්ත ප්‍රදේශයේ තියෙනවා පහළ ළිදක් ඒ අය වතුර ගන්න ඕන කන්දකට පොඩි වතුර මෝටරයක් තමයි තියෙන්නේ ඒ මෝටරය නිතරම කැඩෙන බැවින් මේ සම්බන්ධ ඔබතුමාගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා. එම ගම් වැසියන් එම ළිඳ පරිහරණය කරනු ලබයි. ප්‍රාදෙශීය සභාව තනියෙන් කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. රජයේ උදව් මේ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනවා. එම දමිල ජනතාවට ඔවුන්ගේ නිවාස වලට ගමන් කිරිමට පාරක් නැහැ. එම නිසා පාරත් සංවර්ධනය කළයුතු බව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණන මහතා**

වතු ප්‍රදේශ තුනක් මම නියෝජනය කරනවා මේ වතුකර ජනතාවට ජලය ලබා දිමට කටයුතු කරන්න ඕන. එම නිසා ජලය ලබා දිම සම්බන්ධයෙන් පළමුව පියවරක් ගන්න ඕන බවත්, වතුකර ජනතාව සඳහා ඔප්පු ලබා දිමේ කටයුත්ත ඉක්මන් කරන්න මෙන් අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දිකා ත්‍රිමන්නා මහත්මිය**

මම යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්, බෝපිටිය වත්තේ නිවාස 06 හා පැණිගල වත්තේ නිවාස 09ක් තියෙන්නේ ඔවුන්ට කිසිම පහසුකමක් නැහැ. ගමට ගෙයක් වැඩසටහන යටතේ ගෝඨාභය ජනාධිපතිතුමාගේ පාලන කාලයේ මෙම වතු දෙකට නිවාස හදලා දෙන්න මම උත්සහ කළා. නමුත් මේ වතු සමාගම් දෙකෙන්ම පර්. 05ක් දුන්නේ නැහැ. මම ඉල්ලිමක් කරා ගිය පාලන කාලයේ දී මෙම වතු දෙකටම යන්න පාර හදන්න අමුද්‍රව්‍ය දෙන්න සභාවේ සේවකයින් සහ යන්ත්‍ර සූත්‍ර භාවිතා කරලා පාර හදන්න. ඒ සඳහා ඔවුන් කිසිම විටක ඇහුම්කන් දුන්නේ නැහැ. මෙම වතු සමාගම් වෙතින් ඉල්ලිමක් කරන්න මෙම මාර්ගය හදන්න අමුද්‍රව්‍ය ලබා දෙන ලෙසත් අපගේ ශ්‍රමය ලබා දෙන්නම් යන්න ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතා**

දේශපාලන වශයෙන් අපි පාරවල් හදනවා. මෙහිදි හාම්පුත්තු කිසිම සාධාරණයක් සිදු කරන්නේ නැහැ මේ දෙමළ ජනතාව වෙනුවෙන්. මොවුන්ට කිසිම සහනයක් ලබා දෙන්නේ නැහැ. මෙම යෝජනාව ක්‍රියාත්මක කර ජනතාවට සහනයක් සලසා දිය යුතු බව අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා**

මෙම යෝජනාව කාලෝචිත යෝජනාවක්. මද්දෙගෙදරවත්ත යාමට පාරක් නැහැ. එම නිසා මාර්ගය සකස් කර දෙන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ මහතා**

26 වතුයායේ පාර සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා. ඔවුන් අපට උපරිම සහයෝගයක් ලබා දිලා තියෙනවා. 90 වතු යායේ නිවසක් හදන්න ඉඩමක් පවා වෙන් කරලා තියෙනවා. මේ සම්බන්ධයෙන් අපේ ආණ්ඩුව පූර්ණ මැදිහත්විම සිදුකරන බව අදහස් කරන ලදී.

සභාව තුළ අපේ මේ නිහාල් මන්ත්‍රීතුමා හැමවෙලාවෙම මේ යෝජනාවක් ඉදිරිපත් කරන විට එය ආණ්ඩුවට පෙෂර් එකක් කරන්න හදනවා. මං හිතනවා ඒක නිසා ඔබතුමා අදාල ප්‍රශ්නය විතරක් කතා කරන්න ඔබගේ ටොම්යා බැදගන්න වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

එහෙම අපහාසාත්මකව සභාව තුල කතාකරන්න එපා. එම නිසා මෙම නිහාල් මන්ත්‍රීතුමා කිසිම වෙලාවක රජයට ඇගිල්ල දික්කරලා කතා කරපු අවස්ථා මම දැකලා නැහැ. එම නිසා එම වචනය ඉල්ලා අසකර ගන්නා ලෙස පවසන ලදී.

තවද මෙම මන්ත්‍රීතුමිය ප්‍රකාශ කලේ මෙම පාරවල් සංවර්ධනය කිරිමට වතු අධිකාරින් මැදිහත් වුනේ නැහැ කියන එකයි යන්න පැහැදිලි කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ මහතා**

නිහාල් මන්ත්‍රීතුමා දිගින් දිගටම විවේචන එල්ල කරනවා. ගරු සභාවේ යෝජනා වලට අමතරව එම නිසා මගේ වචනයකින් නිහාල් මන්ත්‍රීතුමාගේ හිත් රිදිමක් පැරිමක් සිද්ද වුණා නම් මම ඒක ඉල්ලා අස්කර ගන්නවා ඒ සම්බන්ධයෙන් සමාව ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

මන්ත්‍රීතුමා මම ඒක ගන්නේ පෞද්ගලිකවම ගන්නේ තර්ජනයක් හැටියට. මේ දේශපාලනයේ දී අපි තර්ජන වලට බයේ දේශපාලනය කරන්නේ නැහැ. ටොම්යා බැද ගන්න කියන එක මම කියනවා තුමාට ඉල්ලා අස්කරගන්න කියලා. එහෙම නැතුව ජනතා විමුක්ති පෙරමුණ තවදුරටත් ලැස්ති වෙනවා නම් තමන්ගේ ආණ්ඩු බලය පාවිච්චි කරලා තර්ජනය කරලා මෙම සභාවේ කටයුතු කරගෙන යද්දි මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලිකව නම පාවිච්චි කරලා දේශපාලනය කරන්න අපි කියනවා ඒ දේශපාලනයට යටත් වෙන්නේ නැහැ ජීවිතය පරිත්‍යාග කරලා දේශපාලනය කරන්න දේශපාලනය තොරගත්ත දේශපාලන ව්‍යාපාරයක් අපි ඒ නිසා ජනතා විමුක්ති පෙරමුනේ මේ කියන ටොම්ය බැදගන්න කියන තර්ජන වලට යටත්ව බයේ දේශපාලන ව්‍යාපාරයක් නොවේ අපි. එමනිසා ඔබතුමා අර කරපු තර්ජනය ඉවත් කර ගන්න යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.ආර්. චතුර සම්පත් මහතා**

වතුකරය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට වෝගන් වත්ත ඉහල කොටසට ජලය ලබා ගැනිම සඳහා ජල සම්පාදන මණ්ඩලය සමඟ කතා කරලා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටින ලදී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් මොහොමඩ් රම්සාන් මහතා**

ආණ්ඩුව සමඟ කතා කරලා මේ ඉඩම් ලබා දිම හැකි ඉක්මණින් කටයුතු කරන මෙන් ඉල්ලා සිටින අතර, ඉස්ලාම් මාවත කන්ද උඩ සිටින ජනතාව වතුර ප්‍රශ්නය තියෙනවා ජල සම්පාදන මණ්ඩලය හා සම්බන්ධ වෙලා හැකි ඉක්මණින් ජලය ලබා ගැනිමට වැඩ පිලිවෙලක් සකස් කර දෙන මෙන් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

අපි ඉදිරියේ දී වතු අධිකාරි සමග සාකච්ඡාවක් කිරිම බලාපොරොත්තුවෙන් සිටිනවා. ඒ අවස්ථාව සඳහා මන්ත්‍රීවරුන් කැඳවන්නම්. හැමෝගෙම අදහස් එක්ක ඉදිරියට යන බව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.3 හොරවල උපකාර්යාලය හා ගල්මත්ත උපකාර්යාල වල ප්‍රධාන ගොඩනැගිලි දෙක අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.4 ප්‍රචාරක දැන්වීම් පුවරු සම්බන්ධව දැනට අවිධිමත් ආකාරයෙන් හා අවසරයකින් තොරව මාර්ග වල ඉදිකර ඇති සියළු දැන්වීම් පුවරු හා විදුලි දුරකථන කණුවල සවි කරන දැන්වීම් පුවරු ගලවා නැවත ක්‍රමවත්ව වැඩපිළිවෙලක් සැකසීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ පස්සේ සල්ලි බදින්න තියෙන සියල්ල දැනුවත් කරලා තියෙන්නේ. ආයතන PRD, RDA, අපට මුදල් බැන්දායින් පස්සේ සභාවේ තාක්ෂණ නිලධාරියෙක් හරහා ස්ථානය පරික්ෂා කර බලා මෙම බෝඩ් සවි කිරිමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කරගෙන යනවා. මින් ඉදිරියේ දී කොයිම තැනකවත් අපගෙන් අවසරයක් නැතුව බෝඩ් සවි කිරිමට අවසරයක් නැති බව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.5 යටදොලවත්ත 802/ඩී ඇලගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.ඒ.ඩී. තිළිණි මධුෂාණි සිරිවර්ධන මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම ඇලගහවත්ත මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ ඇති මාර්ගයක් බැවින් මෙම මාර්ගය සංවර්ධනය කිරිම කළයුතු බව අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

පසුගිය මුදල් වර්ෂය ඇතුලේ විශාල මාර්ග ප්‍රමාණයක් තියෙනවා සංවර්ධනය කිරිම සඳහා යෝජනා වෙච්ච. ඒ සඳහා මුදල් වෙන් කරලා තියෙනවා. ඒ මාර්ග වල සංවර්ධනය පටන් ගන්නේ කවදාද කියලා ප්‍රශ්නයක් තියෙනවා. එකේ තියෙනවා බෝදරගම පාර්ක් කියන නිවාස ව්‍යාපෘතියේ පාරක් ලක්ෂ 10ක් වෙන් කරපු අවුරුදු ගානක් තිස්සේ. අපි මේ වැඩ කරන්නේ ලේකම් පාලනයේදී හදපු අයවැය ඒ අයවැය යටතේ තමයි අපි මේ ක්‍රියාත්මක වෙන්නේ අළුත් අයවැයක් නෙමෙයි. මේ අයවැයේ නිශ්චිත පාරවල් ටිකක් තියෙනවා හදන්න ඕන කියලා ඒ සඳහා මුදල් වෙන් කරලා තියෙනවා. එම නිසා ඇලගහවත්ත

මාර්ගය හදන අවස්ථාවේ දී ම බෝදරගම පාර්ක් එකේ වෙන් කරන ලද මුදල් වලින් ඒ පාරත් හදනවාද යන්න හදන්න පුළුවන්ද හදන එක සුදුසුයි කියන එක අදහන් දක්වන ලදී

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.6 ගලි බවුසරයක් ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය**

මෙය ඉතා කිලෝචිත යෝජනාවක් බව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

.

ඊ-1.7 මතුගම බලප්‍රෙද්ශයේ සහ බල ප්‍රදේශයෙන් පිටත ජනතාව සඳහා අවමංගලා උත්සව පැවැත්විමට හා මහජන ගෞරවය ලබා දෙන උත්සව ශාලාවක් ඉදිකිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.8 මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් කලාප පුළුල් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ වන විට වරිපනම් කලාප ඇති කිරිම සඳහා අපේ නිලධාරින් කටයුතු සිදු කරමින් සිටිනවා. හැම කොටසක්ම අපට වරිපනම් කලාපයට ඇතුලත් කරන්න බැහැ එම නිසා හදුනාගත් කොටස වරිපනම් කලාපයට ඇතුලත් කරලා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලස්වන බව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය**

ඊ-1.9 797ඒ පුස්සලමුල්ල ග්‍රාම සේවා වසමේ එගොඩවත්ත මාර්ගයේ ඉදිරි කොටස සංවර්ධන කටයුතු කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාවින්දාා ඉදුවරණී මෙනවිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.10 මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සභා සතු සියළු මාර්ග වල විදුලි බල මණ්ඩලය හෝ ටෙලිකොම් ආයතනය මගින් අළුතින් සිටුවනු ලබන කණූ ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් යුක්තව සිටුවීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මෙනවිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සභාවේ තාක්ෂණ නිලධාරින් හෝ දැනුවත් විය යුතුයි අපේ පාරවල්. PRD, RDA පාරවල් නම් අපිට කරන්න අමාරු නමුත් සභාව සතු පාරක් නම් අපි ඒක අනිවාර්යයෙන්ම සභාව දැනුවත් කරලා ඉදිරියේ දී අවශ්‍ය කටයුතු කරන්න කියලා ටෙලිකොම් අයතනයෙන් හා ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලා සිටින්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මේ යෝජනාව සම්බන්ධයෙන් විදුලි බල අමාත්‍යාංශයේ ඉදලා අමාත්‍යාංශ ලේකම්වරයා දක්වා දැනුවත් කළයුතු කාරණයක්. නිතිපතිතුමා දැනුවත් කරන්න ඕන. විදුලි බල මණ්ඩලයට කණූ සිටිවීමට අයිතිය තියෙනවා වගේම අපිට මහජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමට අයිතියක් තියෙනවා.මෙම යෝජනා ප්‍රාදේශීය වශයෙන් නෙමෙයි ජාතික තලයේ කතා කරන්න ඕන යෝජනාවක්. එම නිසා මෙම යෝජනාව සම්මත කරලා අදාල ආයතන දැනුවත් කළයුතු බව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මෙය ඉතා කාලෝචිත මාතෘකාවක්. විදුලි බල මණ්ඩලය සහ ටෙලිකොම් ආයතනයට ප්‍රාදේශිය සභාව හරහා අප බල ප්‍රදේශයේ පවතින සියළුම මාර්ග වල විදුලිය ලබා දිම සඳහා හෝ ටෙලිකොම් එකෙන් කණූ සිටුවන්නේ නම් ප්‍රාදේශීය සභාවෙන් අවසරයක් ලබාගෙන සිදුකරන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.11 803 ඒ හේනගම ග්‍රාම නිලධාරි වසම කේන්ද්‍ර කරගනිමින් 2025.07.26වන දින ප්‍රතිසංවිධානය කරන ලද හේනේගම ශ්‍රම ශක්ති ප්‍රජා මණ්ඩල ප්‍රතිසංවිධානය කිරිමෙන් පසුව ක්‍රියාකාරිව කටයුතු කරන ප්‍රජා මණ්ඩලයක් ලෙස හැදින්විය හැකිය. ඒ අනුව මෙම ප්‍රජා මණ්ඩලය කළුතර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ලියා පදිංචි කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.12 2025 සාහිත්‍ය මාසය නිමිත්තෙන් සැප්තැම්බර් මාසය හා 2025 ජාතික කියවිමේ මාසය නිමිත්තෙන් ඔක්තෝබර් මාසය තුළ මහජන පුස්තකාල සාමාජිකත්වය නොමිලේ ලබා දිමට සහා අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මෙනවිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.13 පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප.) ගේ අංක LGD/01/2018 හා 2018.05.09 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා පත්කරන මහජන සම්බන්ධතා නිලධාරියාට රු. 14000.00ක මාසික දීමනාවක් ගෙවීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.ආර්. දුමිඳු චතුර සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.14 මතුගම පොදු වෙළඳපල කඩබඳු ගිවිසුම් කාලය අවසන් පහත උපලේඛනයේ සඳහන් බදුකරුවන් සමග නැවත වසර 03 ක් (2025.0910 දින සිට 2028.09.09 දක්වා) සඳහා ගිවිසුම් ගතවීමට අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කඩ අංකය | බදුකරුගේ නම | ගිවිසුම් අවසන් දිනය |
|---|---|---|---|
| 1 | 1 | ජගත් පින්නගොඩ විතාන | 2025.04.30 |
| 2 | 2 | ටී.ඒ..ඩී.ආර්. විජේසේකර | 2025.04.30 |
| 3 | 3 | එම්.කේ අබේසිංහ | 2025.04.30 |
| 4 | 4 | ෂර්ලි බැස්ටියන් | 2024.04.30 |
| 5 | 8 | කවිනි ලක්ෂිකා | 2024.04.30 |
| 6 | 31 | රූපා වීරසිංහ | 2025.04.30 |
| 7 | 33 | එස්. අජිත් ශාන්ත | 2024.04.30 |
| 8 | 36 | කේවී. ලලිතා පද්මිණී | 2025.06.19 |
| 9 | 37 | එස්.අජිත් ශාන්ත | 2024.04.30 |
| 10 | 39 | අ.ඒ.ඩී. මංගලිකා | 2025.04.30 |
| 11 | 40 | පී.ආර්.රුද්‍රිගු | 2025.04.30 |
| 12 | 55 | ටී.ඒ.ඩී.ආර්. විජේසේකර | 2025.04.30 |
| 13 | 68 | සංජීවනී ධම්මිකා | 2024.04.30 |
| 14 | 69 | පියසේන මුණසිංහ | 2024.04.30 |
| 15 | 73 | සුසන්ත රණසිංහ | 2024.12.31 |
| 16 | 76 | විජයසිරි චන්ද්‍රලතා | 2024.04.30 |
| 17 | 136 | අමරා ප්‍රින්සි පෙරේරා | 2024.04.30 |
| 18 | 137 | හේමාල් සංජීව | 2025.04.30 |
| 19 | 142 | ප්‍රභාත් උදය කුමාර | 2024.12.31 |
| 20 | 09 | කේ.ඒ. ගාමිණී | 2022.11.04 |
| 21 | 15 | ඒ. සෝමසිරි | 2022.06.04 |
| 22 | 09 | කේ.ඒ. ගාමිණී | 2022.11.04 |
| 23 | 76 | සී.ඒ.ඩබ්.චන්ද්‍රලතා | 2024.04.30 |
| 24 | 11 | විමල් චන්ද්‍රසිරි | 2022.07.12 |
| 25 | 35 | එන්.එස්.සී. ජයසිංහ | 2022.09.20 |
| 26 | 16 | ගුණදාස ජයසුන්දර | 2022.09.23 |
| 27 | 62 | අජිත් ජයසිංහ | 2024.04.30 |
| 28 | 63 | අජිත් ජයසිංහ | 2024.04.30 |
| | | | |
| | | මාළු කඩ | |
| 27 | 9 | බී.කේ.පියදාස | 2024.04.30 |
| 28 | 10 | රූපිකා මල්කාන්ති ජයසුන්දර | 2024.04.30 |
| 29 | 6 | ජගත් පින්නගොඩ විතාන | 2024.04.30 |
| 30 | 1 | වැලිතරගේ ආසිකා ලක්මාලි | 2023.08.20 |
| 31 | 8 | ප්‍රගීත් චතුරක | 2021.11.21 |

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ගරු සභාපතිතුමනි, මේ අවස්තාවේ දී මගේ අතේ තියෙනවා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම -2025 ජුලි මාසේ පැවැත්වුණ. එහිදි බදු නොගෙවන කඩ ප්‍රමාණයක් තිබුණා නැවත 2025.08.12 මහ සභාවට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව විසින් ලබා ගත් තීරණ ඉදිරිපත් කෙරුණා ඒ තිරණ දැන් මා සතුව පවතිනවා. අදාල ව්‍යාපාරිකයින් කැඳවලා සාකච්චාවක් කරමු කියලා නමුත් අද ඒ තිරණය සලකන්නේ නැතිව යෝජනාවක් ඉදිරිපත් කරනවා ඒ අය නැවත ගිවිසුම් කාලය අවසන් බැවින් නැවත වසර 03කට ගිවිසුම්ගත විමට අනුමැතිය ලබා දෙන්න කියලා කිච්චට මේ සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කළයුතු වෙනවා එමනිසා මේ අය සමඟ සාකච්ඡා කිරිමට අවස්ථාවක් දෙන්න. මෙම යෝජනාව සම්බන්ධයෙන් අපි විරුද්ද වන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

අපගේ මේ ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය සම්පූර්ණයෙන්ම අවලංගු කරලා නැවත අළුතින් කැදවද්දි නියමිත සුදුසුකම් තිබෙන ව්‍යාපාරිකයින්ට මේ සම්බන්දයෙන් අවස්ථාව ලබාදිය යුතුබව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සියළුම බදුකරුවන් කැදවන්න අවශ්‍යතාවයක් තිබුනේ නැහැ මෙතන අපට ගැටළු සහගත තැන් කිහිපයක් තිබ්බා ගිවිසුම අත්සන් නොකිරිම සම්බන්ධයෙන් මේ දාලා තියෙන අය ගිවිසුම අත්සන් කරලා ගිවිසුම නොකඩවා දිගටම ආපු අය මාස තුනක මුදල් ගෙවලා ඇප තැන්පත් මුදල් ගෙවලා මේ ඉන්න කඩහිමියෝ සියල්ල සම්පූර්ණ කරලා තියෙන අය. නමුත් කැදවන්න අවශ්‍ය වන්නේ ගැටළු තියෙන අය. අවුරුදු තුනකට සැරයක් අපි තක්සේරුවකට යනවා මේ අවුරුද්දෙත් අපි තව තක්සේරුවකට යනවා. මෙතනදි තියෙන ප්‍රශ්නේ අතුරුබදු කරුවන්නම්, මෙතනදි මේ ගිවිසුම ඉදිරියට අත්සන් කළයුතුයි අනිවාර්යයෙන්ම එම නිසා මුදල් අරගෙන ඒ ගිවිසුම අත්සන් කලයුතුය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

2022.09.20 ගිවිසුම අවසන් වෙච්ච අය ඉන්නවා එතකොට ඒ අය මේ වන තෙක් මුදල් ගෙව්වද, ගිවිසුමක් නැතුව මුදල් ගත්තේ කොහොමද. යන්න අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.ඒ.ඩී. තිළිණි මධුෂාණි සිරිවර්ධන මහත්මිය**

බදු මුදල් මාස් පතා ගෙවනවා නමුත් මෙතන තියෙන්නේ ගිවිසුම අත්සන් නොකිරිමේ ප්‍රශ්නයක් තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙය සභාවෙන් කරපු කාරණයක් නෙමෙයි මේ අය සභාව විසින් දැනුවත් කරලා තියෙනවා නමුත් ඔවුන් ගිවිසුම් අත්සන් කරන්න ඇවිල්ලා නැතිබව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.ඒ.ඩී. තිළිණි මධුෂාණි සිරිවර්ධන මහත්මිය**

137 කඩකාමරය 2026.05.31 කියන කඩ කාමරය ගිවිසුම් කාලය තවම අවසන් වෙලා නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය**

යෝජනා ඉදිරිපත් කිරිමේදී නැවත නැවත පරික්ෂා කර බලා වාර්තාවක් විදිහට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම 137 කඩ කාමරයේ ගිවිසුම් කාලය 2025.04.30 ලෙස නිවැරදි විය යුත් බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.15 මතුගම ප්‍රාදේශීය සභාව සතු පහත සදහන් දේපල භාෂා ත්‍රිත්වයෙන් පත්තර දැන්වීම් පළකර 2026 වර්ෂය සදහා ටෙන්ඩර් කර බදු දීමට හා මහ සභාවේ අනුමැතියට ඉදිරිපත් කරමි.

| අනු අංකය | දේපල | 2025 වර්ෂයේ අවම ලංසුව | 2026 වර්ෂයේ අවම ලංසුව |
|---|---|---|---|
| 1 | මතුගම පොදු වෙළදපල එළහරක් මස්කඩය | රු.3,900,000.00 (වාර්ෂික) | රු.4,290,000.00 (වාර්ෂික) |
| 2 | වැලිපැන්න පොදු වෙළදපල එළහරක් මස් කඩය | රු.1,400,000.00(වාර්ෂික) | රු. 1,540,000.00(වාර්ෂික) |
| 3 | මතුගම ශ්‍රවනාගාරය අසල පිහිටි කිරිහල | රු. 1,485.00 (දෛනික) | රු. 1633.50 (දෛනික) |
| 4 | හොරවල උපකාර්යාලයේ භූමියේ එලදාව බදුදීම<br>පොල් ගස් 03 , තැඹිලිගස් 04 | රු. 12,210.00 (වාර්ෂික) | රු. 12,850.00 (වාර්ෂික) |
| 5 | අළුත්ගම්ගොඩ පෙර පාසල් භූමියේ එලදාව බදු දීම<br>පොල් ගස් - 06 , තැබිලි ගස් 01 | රු. 7,271.00(වාර්ෂික) | රු. 7,850.00(වාර්ෂික) |
| 6 | මතුගම පොදු වෙළදපල පොදු වැසිකිලිය | රු. 377,355.00(වාර්ෂික) | රු. 415,090.00(වාර්ෂික) |
| 7 | මතුගම නගර මධ්‍යයේ හෝරා ස්ථම්භය | රු. 163,350.00(වාර්ෂික) | රු. 179,685.00(වාර්ෂික) |
| 8 | ගල්මත්ත නව වෙළද සංකීර්ණය අංක 09, 10, 11 හා 12 කඩ කාමර බදු දීම | රු.171,600.00(වාර්ෂික) | රු.188,760.00(වාර්ෂික) |

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙහි පළමු එක හැරුනාම අන් සියල්ලට මම විරුද්ධ නැහැ. මතුගම එළ හරක් මස්කඩයක් තියෙනවාද යන්න මම දැනගන්න කැමතියි. ඒ කවදා සිට ද, මීට පෙර සභාවේදි මතුගමට එළ හරක් මස් කඩයක් එපා යන්න යෝජනාවක් සම්මත කරන ලදි. මතුගම මස්කඩය විවෘත කලේ මොන කාලයේද යන්න සභාපතිතුමනි දැනගන්න පුළුවන්ද

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

2023 මෙම ලේකම්තුමිය එන්න කලින් සහකාර කොමසාරිස්වරයා විසින් අවසරයක් දිලා තියෙනවා මේ මස් කඩය ඉදිරියට කරගෙන යන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මතුගම එළ හරක් මස් කඩය දැනට පවතින්නේ සහකාර කොමසාරිස්වරයාගේ තීරණයක් මත කියන එකනේ මේ කියන්නේ. දැන් මේ සභාවේ ස්ථාවරය මොකක්ද මතුගමට එළ හරක් මස් කඩයක් අවශ්‍යද නැද්ද යන්න. මම හිතනවා එදා හිටපු ස්ථාවරයේම අදත් මේ මන්ත්‍රීවරු ඉන්වා ඇති කියලා. ඒ නිසා ඒ තිරණය අරගෙන ඉස්සරහට යමු යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

මේ සම්බන්ධයෙන් මම එදත් විරුද්ධයි අදත් විරුද්ධයි. මෙතන තියෙන තියෙන ගැටළුව මේකනේ අපි එදා විරුද්ධ වුණා යෝජනා සම්මත කර ගත්තා. කොපමණ යෝජනා සම්මත කරගත්තත් වැඩක් නැහැනේ කොමසාරිස්තුමාට වෙනස් කරන්න පුළුවන් නම්. මේ සම්බන්ධයෙන් යෝජනාවක් ගෙනැල්ලා සම්මත කරමු.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

2026 සඳහා ටෙන්ඩර් කිරිම සඳහා තමයි මේ ඉදිරිපත් කරලා තියෙන්නේ. අපි 2023 සභාවෙන් එළියට ගියායින් පසුව මෙය නැවත වාරයක් ක්‍රියාත්මක වෙලා තියෙනවා. මේ නිලධාරින් නෙමෙයි ඉදලා තියෙන්නේ මීට පෙර හිටපු නිලධාරින් තමයි මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තියෙන්නේ. ඒ දින වකවානු අවශ්‍ය නම් හොයලා මම ඉදිරිපත් කරන්නම්. එම නිසා මේ තියෙන මස්කඩය ටෙන්ඩර් කරන්න හදනවා මිසක අළුතින් එකක් දාන්න හදනවා නෙමෙයි. නැවත වහන්න අවශ්‍ය නම් සභා යෝජනාවක් සම්මත කරලා බදු නොදි ඉන්න පුළුවන යැයි අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

සභාපතිතුමා වගකිමෙන් ප්‍රකාශ කරන්න මෙම යෝජනාව ක්‍රියාත්මක කරන්න කාගේ ඉල්ලිමක්ද යන්න අදහස් විමසන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ සම්බන්ධයෙන් දැන් පිළිතුරක් දෙන්න බැහැ. අපි එන්න කලින් සිද්ධ වු කාරණාවක්. මේ ලේකම්තුමිය එන්න කලින් සිද්ධ වු කාරණාවක් ඉදිරි කාලසිමාව තුළ ලබාදිමට කටයුතු කරන්නම් යැයි අදහස් ප්‍රකාශ ලදී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් මොහොමඩ් රම්සාන් මහතා**

මස් කඩය සම්බන්ධයෙන් යෝජනාවක් කරලා ඒ සම්බන්ධයෙන් ඡන්දය විමසිමක් සිදු කර සම්මත කරන්න යැයි අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

මේ මස් කඩය දෙපාරක් වැහුවා දෙපාරක් ඇරියා මේකට ආවේ දේශපාලන කඳවුරු දෙකේ ප්‍රශ්නයක් දෙවන වතාවේ ආවේ මස් කඩයේ අවශ්‍යතාවය හා සැබෑ විරෝදය හා පුහු විරෝධයකුත් තිබුණා ඒක තමයි ඇත්ත කතාව. දැන් මේ මස් කඩය ඇරලා තියෙන්නේ පෙර හිටපු ලේකම් තුමිය හා නිලධාරින් විසින්, දැනුත් මේ මස් කඩය සඳහා ගිවිසුමක් තියෙනවා. මේ දැන් කරන්නේ මේ මස් කඩය 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරිමටයි යෝජනා කරන්නේ ටෙන්ඩර් කිරිමට බාධාවක් නැහැ 10% වැඩිකරලා තමයි කරලා තියෙන්නේ අපි මේක කරන්න ඉඩ දෙමු මේ සභාවේ ආදායම් යැයි අදහස් දක්වන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

පුවත් පතේ පළ කිරිම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් පල කිරිමක් නෙමෙයි. මේ මස් කඩය වහලා තියපු කාලයේ අහිමි වු ආදායමට වගකියන්නේ කවුද කියලා දැනගන්න කැමතියි. මේ යෝජනාව සම්බන්ධයෙන් අපගේ විරෝධයක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.16 පළාත් සංවර්ධන ප්‍රදාන - 2025 යටතේ ව්‍යාපෘති අංක A258183149007 දරණ මීගම පෙර පාසලේ සිවිලිම, වැරැන්ඩාව, ගේට්ටුව, වැලිකිළිය හා දොර අලුතින් ඉදිකිරිම ව්‍යාපෘතිය සඳහා රු. 2500000.00ක ප්‍රතිපාදන අනුමත කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී.**
**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.17 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2025 යටතේ ව්‍යාපෘති අංක S256133149006 දරණ මතුගම ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනයට හලර් මැෂින් 01ක් ලබා ගැනිම ව්‍යාපෘතිය සඳහා රු. 3000000.00ක ප්‍රතිපාදන අනුමත කර ඇත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා ගරු සභාවට යෝජනා කරමි.
**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**
**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.18 මෙම කාර්යාලයේ චෙක්පත් අත්සන් කිරීමේ විකල්ප දෙවන අත්සන්කරු වශයෙන් කටයුතු කළ කළමනාකරණ සේවා නිලධාරී 1 ශ්‍රේණියේ නිලධාරිනී පී.මංගලිකා දමයන්ති මිය 2025.07.30 දින සිට විශ්‍රාම ලබා ඇති බැවින්, මේ දක්වා ඇය වෙත ලබා දී තිබූ ඉහත බලය අවලංගු කර, මෙම කාර්යාලයේ කළමනාකරණ සේවා නිලධාරී 1 ශ්‍රේණියේ නිලධාරිනියක ලෙස සේවය කරන ඩී.එස්. ජයසිංහ මිය වෙත චෙක්පත් අත්සන් කිරීමේ විකල්ප දෙවන අත්සන්කරු වශයෙන් බලය පැවරීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.
**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**
2025.07.30 දින විශ්‍රාම ගිය මංගලිකා දමයන්ති මහත්මිය නැවත කාර්යාලයට ඇවිල්ලා රාජකාරි කටයුතු සිදුකරනවා. මේක බරපතල වරදක් යැයි අදහස් දක්වන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**
ඒ සම්බන්ධව තොරතුරු සොයා බලා ලබන සභා වාරයට කලින් ලබා දිමට කටයුතු කරන්නම් යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය**
ඇය කාර්යාලයේ අසුන්ගෙන ලිපිගොනු පරිහරනය කරනවා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**
අද දින සිට එය නොවන වගබලා ගන්නවා මම. මේ පිලිබඳව සොයා බලා දැනුවත් කරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1-19මතුගම ප්‍රාදේශිය සභාව වෙත ගොනුකර ඇති නඩු ලිපිගොනු වල වාර්තමාන තත්ත්වය පිළිබඳව දැනගැනිම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

| අංශය | නඩුවේ අංකය ආරම්භක දිනය | නඩුවේ නම | වර්තමාන තත්වය | නඩුව ඇති උසාවිය |
|---|---|---|---|---|
| 01 | L3660 2008/10/10 | මතුගම ප්‍රජා ශාලාව හා ඉඩම් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මතුගම ආනන්ද ශාස්ත්‍රාලය නිවාස සමිතියට විකුණා අයිතිය ඉල්ලිම. | තින්දු ප්‍රකාශය භාර දිම වාර්තා ඉදිරිපත් කිරිම. | දිසා අධිකරනය විත්ති කරු. |
| 02 | L4730 2018/04/05 | අදාලව පරපත් තොටුව මාස්වෙල එපිට දක්වා මාර්ගය පවරා ගැනිම. | විත්තියේ සාක්ෂි සඳහා නියමිතව ඇත. | දිසා අධිකරනය විත්ති කරු. |
| 03 | 34364/17 2017/03/02 | හිඟ වරිපනම් ලබා ගැනිමට යාමේදි සභාවේ නිලධාරින්ට බාධා කිරිම හා පහර දිම. | නීති උපදෙස් සඳහා යොමු කර ඇත. | පැමිණිලිකරු ආදායම් පරිපාලක සුමිත් සිංවර්ධන |
| 04 | VA/PHC/75 2020 2018/07/09 | ඇල්ටෝනියා ගස් දෙකක් දැනට පෙංලව පවතින්නේද යන කරුන. | නැවත විවාදයට නියමිත කර ඇත. | කොළඹ අභියාචනාධිකරණය විත්තිකරු |
| 05. | MR 3882 2018.09.27 | වැලිපැන්න පොදු වෙළඳපොල 01 කඩ කාමරය සම්බන්ධව | පැමිණිල්ලේ වැඩිදුර ශාක්ෂි කැදවීමට නියමිතයි | දිසා අධිකරණය පැමිණිලිකරු |
| 06 | 90773 2023.09.25 | වලගෙදර මහජන සෞඛ්‍ය පරික්ෂන කොට්ඨාශ ය ආපන ශාලා වැටලීම | විභාගය සඳහා නියමිතයි | මහේස්ත්‍රාත් අධිකරණය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී |
| 07 | P 6103 | නවුත්තුඩුව පුස්තකාලය පහිටි ඉඩමේ නඩුව | මූලික මැනීම් වාර්තා සඳහා නියමිතයි | දිසා අධිකරණය විත්තිකරු |
| 08. | Writ 77/2024 2024.01.15 | මතුගම විලේගොඩ පාර අංක 20 හි සුරමයා හි පදිංචි තිත්ත අප්පුහාමිලාගේ රංජනි මල්කාන්ති සිරිවර්ධන යන අයගේ ඉඩමේ පොල් ගස් 5ක් කොස්ගස් 1ක් හා ගිනිකූරු ගස් | විවාදයට නියමිතයි. | මහාධිකරණය විත්තිකරු |

| | | | | |
|---|---|---|---|---|
| 09 | L3862<br>2015/01/22 | ආදාගල පාරේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය අසල ජල යෝජනා ක්‍රමයේ ලිද තැනීමට එරෙහිව(ගැමි අරුන ජල ව්‍යාපෘතිය.) | අවසන් දිනය. 10/15 | වග උත්තරකරු දිසා අධිකරණය. |
| 10 | Special<br>5/2008<br>2008/07/22 | මතුගම වැලිමානාන,ආචාර්ය ගොඩැල්ල පාර ජල කානුව සම්බන්ධව. | වැඩිදුර හරස් ප්‍රශ්න. | දිසා අධිකරණය I විත්තිකරු දිසා අධිකරණය. |
| 11 | P4872<br>2010/04/01 | වැලිපැන්න පොදු වෙළඳපල ඉඩම හා සම්බන්ධ නඩුව. | තින්දුව.10/23 | දිසා අධිකරණය විත්තිකරු. |
| 12 | 94916<br>2014/11/13 | අනතුරු දායක පුලුන් ගසක් සම්බන්ධව. | වැඩිදුර විභාගය. | දිසා අධිකරණය විත්තිකරු. |
| 13 | P4975<br>2013/05/06 | නඩත්තුව හීන්දෙනිය උඩුමුල්ල නොහොත් දියපහරගහ ලන්ද ඉඩම සම්බන්ධව. | මැණුම් වාර්තා. | දිසා අධිකරණය විත්තිකරු.<br>දිසා අධිකරණය. |
| 14 | MC<br>17701/15<br>2020/01/17 | පස් කැපීමක් සම්බන්ධව.B.A. සුරාජ් U. තරංග,අංජන, K.D.සමන්ත,පුෂ්පා කුමාරි. k.V.D. ප්‍රියන්ත | වැඩිදුර විභාගය. | විත්තිකරු මහේස්ත්‍රාත් අධිකරණය. |
| 15 | MR 5096<br>2025/01/30 | තාප්පයක් කඩාවැටීම සිප්ලි අධ්‍යාපන ආයතනය. | සංශෝධිත පැමිණිල්ල. ඉදිරිපත් කිරීම. | දිසා අධිකරණය විත්තිකරු. |

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**
**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-1.20 **ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ සංශෝධිත යෝජනාව පහත පරිදි සංශෝධනය කර ඉදිරිපත් කරමි.**

පළාත් පාලන සතිය සම්බන්ධ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ LGD/03/02/05 අංක හා 2025.08.06 දිනැති ලිපියට අනුව Zoom තාක්ෂණයෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩ සටහනේදී 2025.09.15 සිට 2025.09.21 දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති පළාත් පාලන සතිය වැඩ සැලැස්ම ගරු සභාවට යෝජනා කරමි

<u>පළාත් පාලන සතිය මතුගම ප්‍රාදේශීය සභාව</u>

සංශෝධිත වැඩ සටහන

| දිනය | ක්‍රියාත්මක කරන වැඩ සටහන | පවත්වන ස්ථානය | සහභාගී කරගනු ලබන රාජ්‍ය,පෞද්ගලික ආයතන |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| 01.2025/09/15<br>ජංගම සේවා දිනය | I.සමාරම්භක උත්සවය. | මතුගම ශ්‍රවණාගාරය. | කළුතර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය ,ප්‍රාදේශිය සභාව.<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය.<br>ප්‍රාදේශිය ලේකම් කාර්යාලය.<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ,කටුගහහේන රෝහල. |
| | II.පෙර පාසල් දරුවන් සඳහා දන්ත සායනක් පැවැත්විම. | මතුගම ශ්‍රවණාගාරය. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය. |
| | III.සුවදිවි සායනයක් පැවැත්විම. | | කටුගහහේන රෝහල. |
| | IV.ආයුර්වේද වෛද්‍ය සායනය. | මතුගම ශ්‍රවණාගාරය. | ප්‍රාදේශිය සභාව. |
| | V.නගරයේ නගරයේ මාර්ග පිරිසිදු කිරිම. | මතුගම නගරය. | මාර්ග සංවර්ධන අධිකාරිය(සතු මාර්ග) , පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරිය(සතු මාර්ග) |
| 02.2025/09/16<br>සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය. | I.ජංගම සේවා වැඩසටහන.<br>(ආයුර්වේද ජංගම සායනය , පුස්තකාල ජංගම සේවා , කොම්පෝස්ට් පොහොර සහනදායි මිලට ලබා දිම.) | පෙත්තකන්ද විහාරස්ථානය, දේවගොඩ විහාරස්ථානය , හොරවල නිග්‍රෝධාරාම විහාරස්ථානය , | ප්‍රාදේශිය සභාව. |
| | II.පොදු ස්ථාන පිරිසිදු කිරිම.<br>මාර්ග දෙපස ගස් වල අතු කපා ඉවත් කර මාර්ග පිරිසිදු කිරිම | විහාරස්ථාන ආශ්‍රිත ප්‍රදේශ. | ප්‍රාදේශිය සභාව. |
| | III.ඩෙංගු මර්ධන වැඩ සටහන. | මතුගම නගරය | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය , මතුගම ප්‍රාදේශිය සභාව. |
| 03.2025/09/17<br>ආදායම් ප්‍රවර්ධන දිනය. | මහජනතාව වෙත ශබ්ද විකාශන යන්ත්‍ර මගින්/සමාජ මාධ්‍ය ජාලා (Face | මතුගම , යටදොලවත්ත , ගල්මත්ත. | ප්‍රාදේශිය සභාව. |

| | | | |
|---|---|---|---|
| | Book,whatsapp) යන උපාංග භාවිතා කරමින් ආදායම් ප්‍රවර්ධන කටයුතු පිලිබඳ පුළුල් ප්‍රචාරයක් ලබා දිම. වරිපනම් , ප්‍රාදේශිය සභාවට අයවිය යුතු අයවීම් නියමිත පරිදි සිදු කිරිමට ජනතාව පෙළඹවිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. වරිපනම් Online මගින් ගෙවිමට හැකියාව ඇති බවට ජනතාව දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්විම. | | |
| 04.2025/09/18 මහජන උපයෝගිතා දිනය. | I.බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කල යුතු අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු පිළිබඳව මහජන අදහස් යෝජනා ලබා ගැනිම.වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරිම සඳහා මහජනයාගේ අදහස් හා යෝජනා ඇතුලත් කිරිම. | මතුගම බල ප්‍රදේශය. | ප්‍රාදේශිය සභාව. |
| | II.සුසාන භූමි පවිත්‍ර කිරිම. | සියලුම කොට්ඨාශ ආවරණය වන පරිදි . | මන්ත්‍රීතුමන්/තුමියන් සම්බන්ධ වි ග්‍රාමිය කමිටු එකරාශි කර ක්‍රියාත්මක කිරිම. |
| | III.පොළ භූමිය තාර දැමිම. | ගල්මත්ත. | ප්‍රාදේශිය සභාව. |
| | IV.ඔරලෝසු කණුව වර්ණාලේප කිරිම. | මතුගම. | ප්‍රාදේශිය සභාව. |
| | V.ආදාහනාගාරය පිරිසිදු කිරිම, සේදිම. | පාන්තිය. | ප්‍රාදේශිය සභාව. |
| 05.2025/09/19 පරිසර හා රුක් රෝපණ දිනය. | I.ප්‍රාදේශිය සභා කාර්ය මණ්ඩලය සම්බන්ධ කරගෙන එල්ලේ තරගයක් හා ක්‍රිකට් | වලගෙදර ක්‍රීඩාංගනය. | ප්‍රාදේශිය සභාව. |

| | | | |
|---|---|---|---|
| | තරගයක් පැවැත්වීම. | | |
| 06.2025/09/20 අධ්‍යාපන හා පුස්තකාල ප්‍රවර්ධන දිනය. | I.ජංගම පුස්තකාල සේවා ආරම්භ කිරිම. | උගුල්වැටිකන්ද ප්‍රජා ශාලාව. | උගුල්වැටිකන්ද ප්‍රදේශ වාසින් හා පුස්තකාලය. |
| | II.පුස්තකාල පාඨක සමාජ අතර කවීක,රචනා තරගයන් පැවැත් විම. | මතුගම මහජන පුස්තකාලය. යටදොලවත්ත , හේනෙගම , නවුත්තුඩුව , ගල්මත්ත , බටුවන්ගල මහජන පුස්තකාල. | පුස්තකාල පාඨක සමාජ. |
| | III.නොදිරන කසල එකතු කිරිමේ රිය සැරිය වැඩසටහන. | යටදොල වත්ත ,ගල්මත්ත උප කාර්යාල බල ප්‍රදේශ. | ප්‍රාදේශිය සභාව |
| | IV.රුක් රෝපන වැඩසටහන. | රන්නගල , හොරගොඩ පාර , බණ්ඩාරනායක පාර දෙපස. | ප්‍රාදේශිය සභාව , අඩවිවන කාර්යාලය. |
| 07.2025/09/21 ක්‍රිඩා දිනය හා සහතිකපත් ප්‍රදානය. | I.ප්‍රාදේශිය සභාව සතු ළමා උද්‍යානය පිරිසිදු කිරිම. | මතුගම/යටදොල වත්ත. | ප්‍රාදේශිය සභාව. |
| | II.මහජන ක්‍රිඩාංගන පවිත්‍ර කිරිමේ වැඩ සටහන. | මතුගම , යටදොල වත්ත ක්‍රිඩාංගනය. | ප්‍රාදේශිය සභාව. |
| | III.ළමා උද්‍යානය වර්ණාලේප කිරිම. | මතුගම | ප්‍රාදේශිය සභාව. |

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**
**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ-02 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-2.1 796 නවුත්තුඩුව ග්‍රාම නිලධාරී වසමේ කුරුන්ද පාර, මාර්ගය සංවර්ධනය කිරිම සම්බන්ධයෙන් ගරු සභාවට යෝජනා කරමි.

- කුරුන්ද පාර - මීටර් 600
  දුර පාර දෙපස බැම්ම යොදා සුදුසු පරිදි බෝක්කු සමග සම්පූර්ණ කාණු පද්ධතිය සකස් කර මාර්ගය කාපට් කිරීමට .

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. අමිල ගයාන් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-2.2 796 නවුත්තුඩුව ග්‍රාමනිලධාරි වසමෙහි මෙන්ම යාබද වසම්හි ගම්වාසී ජනතාවගේ ශාරීරික සෞඛ්‍ය වැඩි දියුණු කිරීම උදෙසා ඇවිදින මංතිරුව සමඟ උද්‍යානයක් සකස් කර ගැනිම වෙනුවෙන් ලද ඉල්ලීම්වලට අනුව පහත සඳහන් ප්‍රදේශය ආශ්‍රිතව අදාල ඇවිදින මං තිරුව සමඟ උද්‍යානයක් සකස් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

- නවුත්තුඩුව සුගුණසාර මාවත මීටර් 400 ක පමණ ප්‍රමාණයක කොටසක ඇවිදින මංතීරුව සමග උද්‍යානයක් සකස් කර ගැනීම.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. අමිල ගයාන් මහතා විසින් ස්ථිර කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-2.3 796 නවුත්තුඩුව ග්‍රාමනිලධාරි වසමෙහි පිහිටි සොහොන් භූමිය සංවර්ධනයට අදාලව පහත යෝජනා ගරු සභාවට යෝජනා කරමි.

- අදාල සොහොනට අයත් භූමිය මායිම් නිරවුල් කර අනවසර ඉවත් කිරීම සිදුකර නිවැරදි මායිම් සකස් කිරීම
- අදාල මායිම් වටා තාප්පයක් ඉදිකිරීම, ගල්බැම්ම හා දැල් වැට ඉදිකිරීම
- සොහොන් භූමිය සඳහා සොහොන් ගෙයක් ඉදිකිරීම.
- අවශ්‍ය පරිදි බෝක්කු යොදා ඉඩමෙහි ජල බැස්ම විධිමත්ව සලසුම් කර සම්පූර්ණ කාණු පදධතිය සකස් කිරීම.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. අමිල ගයාන් මහතා විසින් ස්ථිර කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-2.4 796 ඒ අලුත්ගම්ගොඩ ග්‍රාම නිලධාරී වසමට අයත් අලුත්ගම්ගොඩ කණිටු විදුහල හා ගම්වාසීන් විසින් පොදුවේ ක්‍රීඩා හා වෙනත් පොදු කටයුතු සඳහා යොදා ගනු ලබන පොදු ක්‍රීඩා පිටිය තුළ පහත සඳහන් සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කළයුතු අතර, ක්‍රියාත්මක කළයුත් වැඩ කොටස සඳහා ගරු සභාවට යෝජනා කරමි.

- ඉඩමෙහි මායිම් නිරවුල් කර ක්‍රීඩාංගනය විධිමත් ලෙස බිම් සකස් කර පාසල හා ගම්වාසීන්ගේ ඉඩම් වලට මායිම් වු කොටසෙහි බැවුම් සහිත කොටස සකස් කර ක්‍රීඩා පිටිය වටා තාප්පය හා දැල් වැට ඉදිකිරීම.
- ක්‍රීඩා පිටිය සඳහා අංගසම්පූර්ණ ක්‍රීඩාගාරයක් හා ක්‍රීඩා මණ්ඩපයක් ඉදිකිරීම.
- වොලිබෝල් පිටියක් සකස් කිරීම.
- සුදුසු කොටසක අවහිරතාවයක් ඇති නොවන පරිදි ළමා උද්‍යානයක් ඉදිකිරීම.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. අමිල ගයාන් මහතා විසින් ස්ථිර කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-2.5 796 ඒ අලුත්ගම්ගොඩ ග්‍රාම නිලධාරි වසමෙහි පිහිටි සොහොන් භූමිය සංවර්ධනයට අදාලව පහත ගරු සභාවට යෝජනා කරමි.

- අදාළ සොහොනට අයත් භූමිය මායිම් නිරවුල් කර, අනවසර ඉවත් කිරීම් සිදුකර නිවැරදි මායිම් සකස් කිරීම
- අදාළ මායිම වටා තාප්පය ඉදිකිරීම, ගල් බැම්ම හා දැල් වැට ඉදිකිරීම
- සොහොන් භූමිය සඳහා සොහොන් ගෙයක් ඉදිකිරීම
- අවශ්‍ය පරිදි බොක්කු යොදා ඉඩමෙහි ජල බැස්ම විධිමත්ව සැලසුම් කර සම්පූර්ණ කාණු පද්ධතිය සකස් කිරීම.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. අමිල ගයාන් මහතා විසින් ස්ථිර කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-2.6 796 ඒ අලුත්ගම්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සේවා පියස පිහිටි භූමිය මතුගම ප්‍රාදේශීය සභාවට අයත් භූමියක් වේ. එම භූමියෙහි පහත සඳහන් සංවර්ධන කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

- සභාවට අයත් ඉඩමෙහි මායිම් නිරවුල් කර ඉඩම වටා ඉතිරි පැති 3 තාප්පය ඉදිකිරීම, ඉදිරිපස පස සේදී යාව වලක්වා අඩි 2ක ගල් බැම්ම සමඟ තාප්පය හා දැල් වැට සමඟ ඉදිරිපස ගේට්ටුව සකස් කිරීම.
- සේවා පියසට ප්‍රවේශ වන ඉඩම ඇතුලත මාර්ගය නිතර වර්ෂාව හේතුවෙන් ජලය එකතු වීමෙන් සේවා පියසට පැමිණෙන සේවා දායක මහජන තාව දැඩි අපහසුතාවයට ලක්වේ. එබැවින් ප්‍රවේශයේ සිට සේවා පියසට යන මාර්ගය ගල් අතුරා සංවර්ධනය කිරීම හා
- විධිමත් ලෙස ජලය බැස යන පරිදි ඉඩම සකස් කර, ඉඩමට ප්‍රවේශ ස්ථානය සඳහා බෝක්කු 2ක් යොදා සම්පූර්ණ කානු පද්ධතිය සකස් කිරීම

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. අමිල ගයාන් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඊ-2.6 යෝජනාව අනුව එම සොහොන් භූමිය අපට අයිතියක් නැහැ. ඒක LRC එකට අයිති ඉඩමක්. නමුත් සංවර්ධන කටයුතු වලදී ගිවිසුම්ගත වෙලා තියෙන්නේ මම හිතන්නේ වැඩිහිටි සමිතිය සමඟ වැඩිහිටි සමිතිය මගින් තොරතුරු ලබාගන්නත් පුළුවන්, ඒ සියළු තොරතුරු ලබාදෙන්න පුළුවන් යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-2.7 796 ඒ අලුත්ගම්ගොඩ ග්‍රාම නිලධාරි වසමෙහි පහත සඳහන් වතු මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පැවතිම හේතුවෙන් ඒ ආශ්‍රිතව ජීවත් වන 300ක පමණ වූ වතු ආශ්‍රිත ප්‍රජාව ඉතා අපහසුතාවලට මුහුණ පා සිටි. කඩිනම් අවශ්‍යතාවයක් සේ සළකා පහත වතු මාර්ගය ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කළ යුතු සංවර්ධනය ගරු සභාවට යෝජනා කරමි.

- වතු නිවාස -90 කොටස සිට වතුයාය හරහා කොස්ගහකන්ද දක්වා මාර්ගය කිලෝ මීටර් 1 පමණ ප්‍රමාණය දෙපස කාණු පද්ධතිය සකස් කර අවශ්‍ය ස්ථානයෙන් හි බෝක්කු දමා මාර්ගය කාපට් කිරීම

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. අමිල ගයාන් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතා**

90 වතුයාය සම්බන්ධයෙන් ඊ-2.7 යෝජනාව සම්බන්ධයෙන් දැඩි අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ඊ-3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

අළුත්ගම්ගොඩ කොට්ඨාසය සම්බන්ධයෙන් ඉතා වැදගත් යෝජනා රාශියක් සගීත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරලා තියෙනවා. අපේ මේ සභාවෙන් මේ යෝජනා ක්‍රියාත්මක කරන්නමං හිතන්නේ අපිට සභාවට ඔබතුමාගේ ආණ්ඩුවෙන් ප්‍රතිපාදන ලබා දෙන්නේ නැහැ කියලා ප්‍රසිද්දියේම කිව්වා. එම නිසා සභාපතිතුමාට විශ්වකර්ම පාන්න බැහැ අපට මේ යෝජනා ක්‍රියාත්මක කරන්න ප්‍රතිපාදන අවශ්‍යයි. ඉතා සුළු ප්‍රතිපාදන ප්‍රමාණයක් තියාගෙන තමයි මේ ගමන යන්නේ ඒ නිසා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඔබතුමන්ලාගේ සියළුම මන්ත්‍රීවරුන්ගෙන් අපේ සභාවටත් ප්‍රතිපාදන ලබා දෙන්න පෞද්ගලිකව නෙමෙයි කොට්ඨස සංවර්ධනය කිරිම වෙනුවෙන් යැයි ප්‍රකාශ කරන ලදී.

ඊ-3.1 මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් වල ප්‍රධාන හන්දි සඳහා මතුගම ප්‍රාදේශීය සභාව මගින් කසළ බඳුන් ලබාදිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

ඊ.3.1 යෝජනාව සම්බන්ධයෙන් පුළුවන් නම් එය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලිමක් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ යෝජනාව සම්බන්ධයෙන් වගකිමක් ගන්න අමාරුයි. මීට පෙර එය ක්‍රියාත්මක කරලා බැලුවා නමුත් එය අසාර්ථක බැවින් එය ක්‍රියාත්මක කිරිමට නොහැකි බවට ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-3.2 804/ඒ වැලිමානාන ග්‍රාම නිලධාරි වසමට අයත් කඩවක ඇල්ල සඳහා විශාල පිරිසක් නැරඹිමට සහ නැමට පැමිණෙන අතර එහි දී ඔවුන් අතින් විශාල වශයෙන් පරිසරය අපවිත්‍ර වන බවට ප්‍රදේශවාසින් චෝදනා කරනු ලබන අතර ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සභාව මගින් සිදුකර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-3.3 කඩවක ඇළට යන මාර්ගයේ කෙළවර පාර ඇළට කඩාගෙන යාම සිඝ්‍රයෙන් සිදුවන බැවින් එය මේ වන විට විශාල අනතුරුදායක තත්ත්වයක පවතී. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුත්තක් සිදුකර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-3.4 802 ඊ තඹරුටිය ග්‍රාම නිලධාරි වසමට අයත් කොමිටියවත්ත ප්‍රජා ශාලා භූමිය නිරවුල් කර වැටක් ගසන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-3.5 ශ්‍රී සෝමපාල මාවතේ වැලිමානාන මංසන්දියට ආසන්න මාර්ගය පෞද්ගලික ලී මෝල් කිහිපයකින් අවහිර වී මාර්ගය පලුදු වි ඇති අතර ඒ සඳහා අවශ්‍ය මැදිහත් විම සිදු කරන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-3.6 දැන්වීම් පුවරු විධිමත් කිරිම සඳහා උපකාරක පන්ති ගුරුවරු සභාවට කැඳවා වැඩසටහනක් සාකච්ඡා කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

ඉතාමත් චිත්‍රාකර්ශනියස්වභාවික ඇල්ලක් තියෙනවා කඩවක ඇල්ල විශාල ජනතාවක් එය නැරඹීමට එනවා මෙමගින් අපිට පුළුවන් විධිමත් වැඩ පිළිවෙලක් සකස් කරලා සභාවට ආදායමක් ලබා ගන්න කටයුතු කරන්න. මේ වන විට ප්‍රදේශවාසින්ගෙන් ලොකු චොදනාවක් තියෙනවා විවිධ අක්‍රමිකතා එතන සිදුවන බවට එම නිසා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරිම මගින් එය මහහරවාගැනිමට හැකියාව තියෙනවා ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනවා.

ඊ-3.3 යෝජනාව අනුව මෙම මාර්ගය කඩාගෙන යාම නිසා ඉදිරියේ දී විශාල අනතුරු සිදුවෙන්න පුළුන් එබැවින් මෙය ඉතා ඉක්මණින් පිළිසකර වෙන්න අවශ්‍ය දෙයක් සභාවේ ප්‍රතිපාදන නොමැතිනම් අදාල ස්ථානයකට යොමුකරලා ඒ වෙනුවෙන් කරන්න පුළුවන් මැදිහත් විම කරන මෙන් ඉල්ලා සිටිනවා.

ඊ-3.4 යෝජනාව අනුව මායිම් නිරවුල් කර වැටක් ගැසිම සම්බන්ධයෙන් අවධානය යොමු කරනා මෙන් ඉල්ලා සිටිනවා.

වැලිමානානේ ඇති ලී මෝල් වල ඇති කොටන් මර්ගය අවහිර නොවන පරිදි ව්‍යාපාර භූමියේ පමණක් එම ව්‍යාපාරය පවත්වාගෙන යන ලෙස ඔවුන් දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිනවා.

දැන්වීම් පුවරු සම්බන්ධව පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරු ගෙන්නලා සාකච්ඡා කර සභාවේ අතුරු ව්‍යාවස්ථාවක් සම්මත කර ගැනිම මගින් සභාවේ ආදායම වැඩිකර ගන්නා මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

ඊ-3.1 සිට ඊ-3.6 සියළුම යෝජනා වලට එකඟ වෙන්න පුළුවන්. ඊ-3.1 යෝජනාව අනුව කුමන හෝ ක්‍රමයකින් මොනිටර් වන ස්ථාන වල හෝ කසල බඳුනක් තියන්න කටයුතු කරමු. මොකද පසුගිය දිනවල සභාවට පැමිණි විශ්ව විද්‍යාල සිසුන් පැවසුවේ නගරයේ ටොෆි කොළයක් දාන්න කසළ බඳුනක් නොමැති බවයි. කඩවක ඇල්ල සංවර්ධන කටයුතු කරන්න පුළුවන් නම් ඒ සඳහා එකඟතාවය පලකර සිටිනවා. කඩවක ඇල්ලට යන මාර්ගයේ ඉවුරු දෙපැත්ත කඩාගෙන වැටෙන්න යනවා ඒ සඳහා සභාව මැදිහත් විය යුතුයි සභාව, 802 ඊ තඹරුටිය ග්‍රාම නිලධාරි වසමට අයත් කොම්ටියවත්ත ප්‍රජා ශාලාව මේ වන විට ප්‍රදේශයේ තියෙන ලොකුම ගැටළුව බවට පත්වෙලා තියෙනවා. මෙම ඉඩම අයිතිය තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මෙය LDO ඉඩම් සංවර්ධනය කිරිමේ ආඥා පනතේ යටතේ ප්‍රදානය කරද්දි පොදු භූමිය තමයි මේ ප්‍රජාශාලා භූමිය කියන්නේ මෙය පැහැදිලිවම මහ ප්ලෑන් එකේ ඉඩමේ ප්‍රමානය සහ ඉඩම නිරවුල්ව තියෙනවා. මෙය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් ලිඛිතව පවරාගෙන සංවර්ධනය කිරිමට හැකියාව ඇති බැවින් මායිම් නිරවුල් ගැනිමට කටයුතු කරන ලෙසත්, සෝමපාල මාවතේ වැලිමානාන හන්දියේ ඇති ලී මෝල් හිමියන් වෙත මෙය ක්‍රමවත් කිරිම හා බාධාවන් ඉවත් කිරිමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

ඊ-3.4 යෝජනාව අනුව මේ ප්‍රජා ශාලා භූමියේ පෙර පාසලක් පවත්වාගෙන යනවා ඒ අවට ඇති ගස් වල අතු දිගේ ගැරඩි මෙම ගොඩනැගිල්ල වෙත එන බව ප්‍රකාශකර සිටියා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා**

පෞද්ගලික බස් නැවතුම් පොලේ හා ලංගම බස් නැවතුම් පොලේ කසල ඉවත් නොකිරිම සම්බන්ධයෙන් චොදනා නගන බැවින් මේ සම්බධයෙන් ඔබතුමාගේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටිනවා

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

පෞද්ගලික බස් නැවතුම් පොල හා ලංගම බස් නැවතුම් පොල කියන්නේ ආදායම් ලබන ආයතන දෙකක් එබැවින් කසල ඉවත් කිරිම සම්බන්ධයෙන් තියෙනවා ක්‍රමවේදයක් ඒ අනුව කටයුතු කරනවා නම් අපි ඒ කාරණාව ඉෂ්ඨ කරනවා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා**

එහෙම වෙන්නේ නැත්නම් PHI හරහා දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

කඩවක ඇල්ල සම්බන්ධ යෝජනාව පිළිබඳව කතා කරද්දි මෙම ඇල්ල සංවර්ධනය කිරිම මගින් මතුගම ලස්සන නගරයක් කිරිමේ සංකල්පයට අනුව මෙවැනි ස්ථාන සංවර්ධනය

කිරිම, පිළිසකර කිරිම නිසා ඒ යෝජනාව සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඒ සඳහා වාරිමාර්ගයෙන් අවසරයක් ලබා ගැනිමට අවශ්‍ය බැවින් ඒ අවසරය ලැබෙන්නේ නම් අපිට පුළුවන් ඒ පාර කැඩි යාමේ අවධානම මඟහරවා ගන්න. ඉදිරි කාලසීමාවේදී ඒ අවසරය ලබාගෙන පාර කැඩි යන මඟහැරවිමට අවශ්‍ය කටයුතු කිරිමට බලාපොරොත්තු වෙනවා.

මේ තඹරුටිය පෙර පාසල භූමිය අප සතු ඉඩමක් නොවන බැවින් ප්‍රාදේශීය ලේකම් සතුයි එය අපට පවරා දෙනවා නම් ඒ අවශ්‍ය කටයුතු සිදුකර මෙම බස් රථ හරවන එක මඟහරවා ගන්න කටයුතු කරන්න අපිට පුළුවන්. මෙම භූමිය අප සභාව සතු භූමියක් නොවිම තමයි දැනට තියෙන එකම ගැටළුව.

**ඊ-04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-4.1 සිහිලැල්තැන්න අදියර 1 පෙරපාසල ප්‍රාදේශීය සභාවට පවරා ගන්නා ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

පෙර පාසල් සභාවට පවරා ගන්න කියලා කියන එක අපිට ඒක කරන්න පුළුන් දෙයක් නෙමෙයි. මෙම පෙර පාසල අපේ ඉඩමක හැඳුවට සභාවේ කිසිම අවසරයකින් තොරව තමයි හදලා තියෙන්නේ. මේ සම්බන්ධයෙන් ස්ථානිය පරික්ෂණයක් සිදු කළයුතුයි. ඒ නිසා මේ අවස්ථාවේ පවරා ගැනිම සිදුකරන්න බැහැ මේ වෙලාවේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-4.2 තල්ගස්ගොඩ ප්‍රධාන මාර්ගයේ බෝගස අසල සිට මාර්ග දෙපස කාණු පද්ධතිය කොන්ක්‍රීට් යොදා සැකසිම හා අනුර මහත්මාගේ නිවස අසල ඇති බෝක්කුව හා චන්දන මහතා අසල ඇති බෝක්කුව අලුත්වැඩියා කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-4.3 තල්ගස්ගොඩ බුදුමැදුර තනා ඇති පොදු ඉඩම මැන නිරාකරණය කර ගැනිම හා එම ස්ථානයේ ඇති පොදු ළිඳ අලුත්වැඩියා කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-4.4 බොන්දුපිටිය හේනගංගොඩ වතුර ටැංකිය අසලින් නිශාන්ත මහත්මාගේ නිවසට යන මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ. සුජිත් කුමාර මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-4.5 ඒ 015 කුරුන්ද පාර මීගම දර්ගානගරය යන ලිපිනයේ පවත්වාගෙන යනු ලබන දූලින ට්‍රේඩින් පුද්ගලික සමාගම (මිරිස් හා කුළු බඩු ඇඹරුම් හල) හේතුවෙන් ගම්වාසින් දැඩි අපහසුතාවයකට පත්ව ඇති බැවින් ACLGK/CA/02/MPS/01-30 අංකය දරණ පළාත් පාලන කොමසාරිස්තුමා විසින් 2025.07.21 වන දින ගරු සභාපතිතුමා වෙත යොමු කරන ලද ලිපියේ සඳහන් කරන ආකාරයට අවට නිවැසියන්ට පීඩාකාරි අන්දමින් මෙම කර්මාන්තය පවත්වාගෙන යන බවට නිරීක්ෂණය වී ඇත. මෙම ගැටලුව සම්බන්ධයෙන් ඔබතුමා විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග. සම්බන්ධයෙන් කොමසාරිස්තුමා විසින් කඩිනමින් වාර්තාවක් ඉල්ලා ඇත. මෙම ගම්වාසින්ගේ ඉල්ලිම පරිදි මෙම කර්මාන්ත ශාලාව මෙම ස්ථානයෙන් ඉවත්කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

මිරිස් මෝල සම්බන්ධයෙන් 2018 වර්ෂයේ සිට එන ප්‍රශ්නයක්, පරිසර කමිටුව රැස්කරලා ස්ථානීය පරික්ෂණයක් සිදුකර මේ සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගතයුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා**

ස්ථානීය පරික්ෂණයක් සිදුකර අඩුපාඩු හදුනාගෙන එය නිවැරදි කිරිමට උපදෙස් දී එය නිවැරදි කරගමු යැයි අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ලැබී ඇති තොරතුරු අනුව මන්ත්‍රීතුමා කියපු විදිහට මධ්‍යම අධිකාරියත්, සභාවේ තාක්ෂණ නිලධාරින් ගිහින් බලලා තියෙනවා එහි අඩුපාඩු පෙන්වා දුන් පසු එය නිවැරදි කර ඇති බව තමයි දැනගන්න තියෙන්නේ. මම මේ සම්බන්ධව ස්ථානීය පරික්ෂණයක් සිදු කරලා නැහැ. මේ සම්බන්ධයෙන් පරිසර කමිටුව රැස්වෙලා ස්ථානීය පරික්ෂණයක් සිදු කර ඉදිරි කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ. සුජිත් කුමාර මහතා**

ඔබතුමා පැවසු ආකාරය ස්ථානීය පරික්ෂණයක් සිදුකර සුදුසු ක්‍රියාමාර්ගයක් ලබා දෙන්න යැයි ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සංවර්ධන කමිටුවට යෝජනාවක් දාලා ඔහුට සුදුසු ස්ථානයක් දෙන්න කියලා කියමු. ව්‍යාපාරයක් කියන්නේ මේක ඩොලර් නිපදවන ව්‍යාපාරයක් එම නිසා අපි මේක වහන්න නොමෙයි කරන්න ඕන පවත්වාගෙන යන්න අවස්ථාව සලසා දෙන්න ඕන. ඔබතුමාගේ යෝජනාවක් විදිහට සංවර්ධන කමිටුවට දාන්න අපි එතකොට ඒ පිළිබඳව අදහස් දක්වන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ. සුජිත් කුමාර මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-4.6 771 බී තල්ගස්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ තල්ගස්ගොඩ පොදු ක්‍රීඩා පිටිය බොන්දුපිටිය විදුහලට යාබදව පිහිටා ඇත. එම ක්‍රීඩා පිටිය තුළ දිවා රාත්‍රි වොලිබෝල් ක්‍රීඩා පිටියක් ඉදිකර දීමට කටයුතු කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-4.7 771ඒ කැප්පෙට්ටිගහලන්ද ග්‍රාම නිලධාරි වසමේ කුරුන්ද මාර්ගය නිසි ආකාරයට පුළුල් කර ඇති නමුත් විදුලි බල මණ්ඩලය මගින් මාර්ගය පුළුල් කිරිමට පෙර ස්ථානගත කර ඇති විදුලි කණු තවමත් මාර්ගයට බාධාවන පරිදි පාර මැද පිහිටා ඇත. එය ඉවත් කිරිම සඳහා ලං.වි.ම. වෙත අවශ්‍ය දැනුම් දිම කර දෙන මෙන් කරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඔබතුමාගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

**ඊ-05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-5.1 වලගෙදර කුරුදිප්පිට ප්‍රදේශය වරිපනම් කලාපයක් කර කසළ එකතු කිරිමේ ට්‍රැක්ටර් රථය කුරුදිප්පිට දක්වා ගමන් කර ප්‍රදේශයේ කසළ එකතු කිරිම කරදෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-5.2 රිටිකැටිය ලක්මාල් වික්‍රමසිංහ මහතාගේ නිවස අසල සිට එම මාර්ගය ඉදිරියට කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-5.3 විශාල පවුල් සංඛ්‍යාවකට ගමන් කිරිමට ඇති එකම මාර්ගය වන මනන්නවත්ත රිටිකැටිය මාර්ග කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-5.4 වලගෙදර උතුර කොළණිය ඉඩල ලඟ කට්ටිය මාර්ගය කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.
**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදී**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-5.5 වලගෙදර උතුර කොළණිය සුනිල් ජයසිංහ මහතාගේ නිවස ඉදිරිපිට ඉඩමේ නිවාස සඳහා ගමන් ගන්නා මාර්ගය කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට ගරු සභාව යෝජනා කරමි.
**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදී**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් පැහැදිලි කරමින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මෙම මන්ත්‍රීතුමා ගෙනා යෝජනා පිළිබඳව පළමුවෙන් ම ස්තුතිවන්ත වෙනවා. රිටිකැටිය මනන්නවත් මාර්ගය ප්‍රාදේශීය සභා ඡන්දයට සති දෙකකට පෙර මෙම මාර්ගය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මැනුම් කටයුතු කළා. ප්‍රදේශයේ ජනතාවට කියලා තියෙන්නේ මාලිමාවට ඡන්දය දෙන්න පාර හදා ගන්න ඕන නම් කියලා. මෙතුමා පිළිබඳව ගෞරවයක් ඇති වෙනවා ජාතික මට්ටමේ බොරුව ප්‍රාදේශීය මට්ටමින් සඵල කරගන්න හදන එක ගැන යන්න අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා**

ජාතික මට්ටමෙන් බොරු කියපු අය ගෙදර, ජනාධිපති ලේකම් කාර්යාලයේ දැනුවත් කිරිම මත තමයි ප්‍රාදේශීය ලේකම්තුමා විසින් තාක්ෂණ නිලධාරින් මගින් මැනුම් කටයුතු සිදුකරේ. මගේ කීමට නොවේ. මෙම යෝජනාව මම කලේ මිනිසුන්ගේ අවශ්‍යතා ඉටු කිරිම ඉක්මණික් කරගන්න පුළුවන් වෙයි කියලා හිතාගෙන තමයි. නමුත් බැරිවුණෝත් ලබන අවුරුද්දේ මුල මේ පාර හදනවා. මම ඔබතුමාට අභියෝග කරනවා පුළුවන්නම් ප්‍රාදේශීය සභාව මගින් සිදු කරන්න කියලා බැරි වුණොත් ලබන අවුරුද්දේ අපි කරනවා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

අපේ නායකයෝ බොරු කියලා ගෙදර ඉන්නවා කියලා කිවුවානේ. දැන් ඔබතුමාලා බොරු කන්දක් කියලා ඊලඟ මැතිවරණයේ දී අපි බලමු ගෙදර ඉන්නවාද නැද්ද යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා**

(දක්වන ලද අදහස් පැහැදිලි නැහැ)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

(දක්වන ලද අදහස් පැහැදිලි නැහැ)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

සෝෂාව නිසා දක්වන ලද අදහස් පැහැදිලි නැහැ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජගත් විමලසිරි මහතා**

සෝෂාව නිසා දක්වන ලද අදහස් පැහැදිලි නැහැ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා**

සෝෂාව නිසා දක්වන ලද අදහස් පැහැදිලි නැහැ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා**

සෝෂාව නිසා දක්වන ලද අදහස් පැහැදිලි නැහැ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. උභයනන්ද පද්මලාල් මහතා**

සෝෂාව නිසා දක්වන ලද අදහස් පැහැදිලි නැහැ

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සභාව වෙත යෝජනාවක් ඉදිරිපත් කිරිමෙන් අනතුරුව එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තීරණ ගන්න අනවශ්‍ය කතා වලට ගිහින් ප්‍රශ්න ඇති කරගන්න යන්න එපා යැයි අදහස් කරන ලදී.

**ඊ-06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-6.1 ලෙව්වන්දුව කොට්ඨාසයේ 792 බටහිර අඹගහවත්ත මාර්ගය ප්‍රාදේශීය සභාවේ මාරගයක් ලෙස පවරා ගන්නා මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-6.2 ප්‍රධාන මාර්ගයේ පමණක් ගමන් කරන කසළ රැගෙන යන ට්‍රැක්ටර් රථය අතුරු පාරක් වන ගොරොක්ගොඩවත්ත හරහා ගොස් නැවත ප්‍රධාන මාර්ගයට සම්බන්ධ කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-6.3 ලෙව්වන්දුව පල්ලිගොඩවත්තට හැරෙන ප්‍රධාන මාර්ගයේ බස්නැවතුම්පලක් ලබා දෙන මෙන් ප්‍රාදේශීය සභාව හරහා මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය**

ඉහත යෝජනා සම්බන්ධයෙන් පැහැදිලි කරමින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මාර්ගයක් පවරා ගැනිම කියන්නේ ලොකු කර්තව්‍යක්. ඉඩම් අයිතිකරුවන් විසින් තෑගි ඔප්පුවකින් සභාව වෙත භාර දිය යුතුයි. ඊට පසුව තමයි පවරා ගැනිමේ කටයුතු සිදු කරන්න පුළුවන් යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය**

එම ප්‍රදේශයේ මිනිසුන් ලෝන් එකක් ගන්න ගියහම මාර්ග ප්‍රාදේශීය සභාව සතු ද යන්න විමසන විටදි ඔවුන් මුහුණ පාන ගැටළුවන් නිසයි මෙම මාර්ගය සභාවට පවරා ගන්නා මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය**

මීට පෙර යෝජනාවක් දැම්මා ගොරොග්ගොඩවත්ත තාප්පයක් පිළිබඳව ඒ සම්බන්ධයෙන් ඔබතුමාලාගේ අවධානය යොමුවුණ බව මට දැනගන්න ලැබුණා. ඒ සම්බන්ධයෙන් ගත් ඉදිරි ක්‍රියාමාර්ගය මොකක්ද යන්න දැනගන්න කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඒ අය දැනුවත් කරා ඔප්පුව අරගෙන එන ලෙස පාර කොච්චරක් ද යන්න විමසා බැලිම සඳහා අදාල ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස අදාල පාර්ශවය දැනුවත් කර ඇති බව අදහස් දක්වන ලදී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

සභාව විසින් මහජනතාවගේ බදු මුදල් යොදවලා කොන්ක්‍රිට් කරවලා, තාර දානවා නම් ලයිට් කණු සිටුවනවා නම් වෙන්දේසි කරුවන්ගේ සල්ලි නෙමෙයිනේ පොදු මහජනතාවගෙන් එකතු කරන ලද සල්ලි වලින් තමයි නඩත්තු වෙලා තියෙන්නේ ඒ නිසා පොදු පාරක් වෙනවා. ඒ ඇති ඉදිරි කටයුතු කරන්න. අපි නඩත්තු කරනවා නම් ඒක ප්‍රාදේශිය සභා පාරක් වෙනවා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජගත් විමලසිරි මහතා**

වෙන්දේසි ඉඩම් අනුමත කරනවා නම් එම පාරවල් අඩුම තරමේ අවුරුදු 10ක් පාවිච්චි කරන්න පුළුන් විදහට පාරවල් හදන්න යැයි ඔවුන්ව දැනුවත් කරන ලෙස අදහස් දක්වන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

දැනට වෙන්දේසි වෙමින් පවතින කිසිම ඉඩමකට අවසරයක් නැහැ පාරවල් ඔවුන්ට හිතුමතේට දාන්න තාක්ෂණ නිලධාරියෙකුගේ අනු දැනුම මත තමයි අවසර දීලා තියෙන්නේ දාන්න. පාරවල්, කාණුපද්ධති ඒ සියල්ල සපුරලා නැති කිසිම වෙන්දේසි ඉඩමකට අපි අවසර දෙන්නේ නැහැ. ඉදිරියේ දි පාරවල්, කාණු පද්ධති, විදුලිය යනාදිය සම්පූර්ණ කරලා තියෙන ඉඩම් වලට විතරයි අවසරය ලබා දෙන්නේ යැයි අදහස් දක්වන ලදී.

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා එළියට ගොස් ඇති බැවින් එතුමන්ගේ යෝජනාව පසුවට තබන ලදී.***

**ඊ-08 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩී. අමන් ප්‍රසාද් මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-8.1 කටුගහහේන - කරම්පැතර යටදොලවත්ත ප්‍රධාන මාර්ගය ස්ථාන 03කින් පමණ කැඩී ඇත. සමස්ථයක් ලෙස මාර්ගය අබලන් වී ඇති ප්‍රමාණය මීටර් 300 පමණ වේ. මෙය මහජනයා භාවිතා කරන ප්‍රධාන මාර්ගයක් වන අතරම ප්‍රාදේශීය රොහලක් වන කටුගහහේන රෝහල ද පිහිටා ඇත්තේ මෙම මාර්ගයේය. එබැවින් මෙය කඩිනමින් සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩී. අමන් ප්‍රසාද් මහතා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් පැහැදිලි කරමින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා ප.ව. 1.45 ට පමණ නැවත සභාව වෙත පැමිණ අසුන් ගන්නා ලදී.***

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

මෙම යෝජනාව ක්‍රියාත්මක කිරිමට තරම් සභාවේ සල්ලි නැහැ මම හිතන්නේ.මෙය සංවර්ධනය කළ යුතුම පාරක් ඒ නිසා ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අමන් මන්ත්‍රිතුමාටම තමයි මේ සම්බන්ධව ක්‍රියා කරන්න වෙන්නේ ආණණ්ඩුව හරහා උදවු අරගෙන මුදල් යොදවලා මෙම මාර්ගය සංවර්ධනය කරන්න. ඔබතුමා කළ ලොකු ජයග්‍රහණයන් වෙයි යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

යෝජනා ඉදිරිපත් කරන්නේ මහජනතාව වෙනුවෙන්. මේ යෝජනා ඉදිරිපත් කරාම ඒ පොදුවේ එන මතයක් තමයි එය ආණ්ඩුවට කියලා කරන්න කියන එක. සභාපතිතුමනි අපි ඔබතුමාටත් කියනවා හැකියාවක් තියෙනවා නම් සහ ඔබතුමාගේ දැනුවත් භාවය සඳහා එම යෝජනා ඔබතුමා වෙත ඉදිරිපත් කිරිමේ කාර්යය අපට පැවරෙනවා. එවිට ඔබතුමාට හැකියාවක් තියෙනවා නම් හැකි ආකාරයට විශ්වාස කරනවා ක්‍රියා කරයි කියලා. එහෙම නැත්නම් අපට පුළුවන් ආකාරයට අපි රජයක් හැටියට යොදවන්න පුළුවන් උපරිම මුදල් ප්‍රමාණය යොදවනවා. අපි දන්නවා මේ හැම යෝජනාවක්ම සභාපතිතුමාට කරන්න බැහැ කියලා අපි දන්නවා අපි බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. අපි කියන්නේ දැනුවත්භාවය තියාගන්න. පුළුවන් අවස්ථාවේ අපි ඒ දේ පළමුවෙන්ම කරනවා. මේ මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රජය යම්කිසි මුදලක් වෙන් කරලා තියෙනවා මේ වන විටට අපි හිතනවා ඒ මුදල ප්‍රමාණවත් වෙයි කියලා යැයි අදහස් දක්වන ලදි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩී. අමන් ප්‍රසාද් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ-07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-7.1 මතුගම පොදු ක්‍රිඩාංගනයේ තිබෙන වොලිබෝල් (ක්‍රිඩා) කරන ස්ථානයේ රාත්‍රි කාලයට විදුලි ලාම්පු ලබා ගැනිම සඳහා ගරු සභාවට යෝජනා කරමි (ජාතික මට්ටමේ ක්‍රිඩකයෝ සිටි)

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-7.2 ඇතුලත්මුදලි පන්සල පාරේ හතරමං හන්දියේ අනතුරු ස්ථානයක් බැවින් එම ස්ථානයට සුදුසු ක්‍රමවේදයක් යොදවන මෙන් ගරු සභාවට යෝජනා කරමි. (රිය අනතුරු බහුල ප්‍රදේශයක්)

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-7.3 නගරයේ සිටින අයිතිකරුවන් නොමැති සුනඛයින් මුළු නගරයේම සැරිසරන බැවින් එම සුනඛයින්ට අවශ්‍ය වැඩ පිළිවෙලක් කරදෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා**

මතුගම ක්‍රිඩාංගනයේ නගරයේ ව්‍යාපාරිකයින්, තරුණයින් බොහො පිරිසක් රාත්‍රී කාලයේ තමන්ගේ ශාරීරික ව්‍යායාම් වෙල යෙදෙන අවස්ථා බොහොමයක් තියෙනවා එම නිසා මම ඉල්ලා සිටිනවා වොලිබෝල් ක්‍රිඩාංගනය ඇති ස්ථානයට විදුලි ලාම්පු ලබාදෙන මෙන්ද,

මතුගම ඇතුලත්මුලිගම පාරේ හතරමං හන්දියේ අනතුරු බහුල ප්‍රදේශයක් බැවින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන්ද,

නගරයේ සිටින මේ සුනඛයින්ව ඉවත් කිරිමට කුමක් හෝ ක්‍රමවේදයක් සකස් කරන මෙන්ද යෝජනා සම්බන්ධයෙන් පැහැදිලි කරමින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ වන විට නවුත්තුඩුව මහා විදයාලයේ දරුවෙකුත් ගුරුවයෙකුත් දෙමාපියන් දෙදෙනෙකුත් අද දවසේ උදේ බල්ලෝ සපා කාලා යැයි ජගත් මන්ත්‍රිතුමා උදේ මාව දැනුවත් කරා. පාසලේ විදුහල්පතිතුමිය මාව දැනුවත් කලා අද උදේ පළමුවෙන්ම කළ රාජකාරිය MOH දැනුවත් කරලා ඒඅවශ්‍ය කටයුතු කරන්න හෙට දිනයේ දී මේ සම්බන්ධව සාකච්ඡාවක් යොදාගෙන තියෙනවා. එම නිසා කෙටි කාලයක් තුළදී ඒ සඳහා අවශ්‍ය පිළියම් යොදන්න කටයුතු කරන බවට අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා**

රාත්‍රිය බොහෝ පිරිසක් වොලිබෝල් පිටියට පැමිණෙනවා ඒ නිසා ඒ පිළිබඳව සභාපතිතුමාගේ අවධානය යොමු කරනවා,

ඒ වගේම CTB ස්ටෑන්ඩ් එක වටේම තියෙන ලොකු ලයිට් ටි පිච්චිලා තියෙන්නේ ඒ පිළිබඳවත් අවධානය යොමු කරන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

අපි මේවන විටත් සැලසුම් කමිටුවේ සාකච්ඡා කරලා තියෙන්නේ. මේ වන විට ඇකඩමියක් හරහා මේක ව්‍යාපාරයක් හැටියට නමුත් මේකේ රාත්‍රි කාලයේ දී වොලිබෝල් ක්‍රිඩාංගනයේ ක්‍රිඩා කරන්න එන අයට මෙය සැලසුම් කළ යුතුයි. නමුත් ඒක ක්‍රමවේදයක් ඇතුලේ ව්‍යාපාරයක් හැටියට ළමයෙකුගෙන් රු. 2000.00ක්, 1500.00ක්, 2500.00ක මුදලක් ගන්නවා ළමයෙක් ට්‍රේනින් කරන්න. ඒ නිසා නොමිලේ අවස්ථාව ලබා දෙන්න අවශ්‍ය නැහැ මේ ගොල්ලන්ට ඒ අයගෙන් මුදලක් අයකරගෙන මේ විදි ලාම්පු සවිකර නිසි ක්‍රමවේදයකට ඒය සිදුකිරිමට ඉදිරියේදී කටයුතු කරන බවත්,

ඇතුලත්මුදලිගම පාර සඳහා උත්තල දර්පණ දෙකක් ඒ පාරවල් දෙපැත්තෙන් සවි කිරිමට අවශ්‍ය කටයුතු ඉදිරි කාලසිමාවේදී කටයුතු කරන බවටත් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා**

දික්හේන ගමේ විදේශ අධාර මත අක්කර දෙකක පමණ ප්‍රමාණයක සුනකයින් සුරක්ෂිත කරන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනවා. MOH සමබන්ධ වෙන්නත් බලාපොරොත්තු වෙනවා කිව්වා. ඔබතුමා හමුවෙලා ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබාගෙන කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සංවර්ධන කමිටුවට යෝජනාවක් දාලා සාකච්ඡා කරන්න. මේ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කරන්න බැහැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජගත් විමලසිරි මහතා**

නේවාසිකව සිටින සුනඛයින් රෙජිස්ටර් කරගෙනයම්කිසි සේවාවක් සපයමින් යම්කිසි ගාස්තුවකට යටත් කරගෙන යම්කිසි වැඩක් කරන්න පුළුන්නම් හොඳයි යැයි යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය**

මම මේ සම්බන්ධයෙන් MOH එකත් එක්ක කතා කළාම ඒ අය කියන්නේ ඒ අයට විසඳුමක් දෙන්න බැහැ ප්‍රාදේශීය සභාවත් එක්ක සම්බන්ධ වෙලා කතා කරලා ඒ පිළිබඳව යෝජනාවක් දෙන්න විසඳුමක් දෙන්න කියලා. ඒ පිළිබඳව ක්‍රියාත්මක වන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවනි හෙට්ටිආරච්චි මහත්මිය**

නිවෙස් වල ඉන්න ගැහැණු සත්තු වන්ද්‍යාකරණය කරන්නේ නැතුව විදි සත්තු වන්ද්‍යාකරණය කරාට වැඩක් නැහැ යනුවෙන් අදහස් දක්වන ලදී.

**ඊ-09 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-9.1 මතුගම ප්‍රාදේශීය සභාවට අයත් සියළු අතුරු මාර්ග එනම්, මතුගම ප්‍රදාන මාර්ග වන කළුතර පාර, නැබඩ පාර, අගලවත්ත පාර හා අළුත්ගම පාර යනාදියට සම්බන්ධ වන අතුරු මාර්ග අතරින් මෙතෙක් නම් කර නොමැති මාර්ග වලට අළුත් නමක් හදුන්වා දී ඒවද ඇතුළුව මෙතෙක් නම් කර ඇති මාර්ග සියල්ලටමද නාම පුවරු සවිකිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**ඊ-9.1 යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතා විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී.**

ඊ-9.2 ඉහත යෝජනාවට අනුරූපව විශේෂයෙන් මතුගම බටහිර පළාත් පාලන ආයතනයට අයත් 805 සි. දකුණට අයත් බාලිකා පාරට සම්බන්ධ වන සියළු අතුරු මාර්ග I පටුමහ, II පටුමග, III පටුමග යනාදි වශයෙන් IX පටුමහ හා X පටුමග වශයෙන් අතුරු මාර්ග 10ක් ඒ ආකාරයටම හෝ වෙනත් සුදුසු ආකාරයකට හෝ නම් කර නාම පුවරු යෙදීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඊ-9.2 යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතා විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී.**

ඊ-9.3 මතුගම බටහිර පළාත් පාලන ආයතනයට අයත් මතුගම දකුණ 805 සී වසමට අයත් ගලබඩයාවත්ත පාරේ සිට ආරම්භ වන මතුගම අළුත්ගම පාරට සමාන්තරව ඕවිටිගල කඩිත්තමංකඩ ඇළ දක්වා දිවෙන කුඩා ඇළ මාර්ගය (කාණු ) පුළුල් කර දෙපස පැති බැමි යොදා සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-9.4 මතුගම බටහිර පළාත් පාලන ආයතනයට අයත් මතුගම යට්ටෝවිට වසමේ විලේගොඩ පාන්තිය අඹගහ අරාව දෙසට දිවෙන ගිලා බැසිමට ලක්ව ඇති මාර්ගය එහි අවශ්‍ය ස්ථාන වලට බෝක්කු යොදා පුළුල් කර සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-9.5 මතුගම බටහිර පළාත් පාලන ආයතනයට අයත් යට්ටෝවිට වසමේ නිවාස 37ක් ඇති පොල්ගහවත්ත කඳු සහිත ප්‍රදේශය සඳහා ජල පහසුකම් ලබා ගැනිමට ගිල්විය හැකි වතුර මෝටරයක් (Horse power -2) ලබා දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-9.6 මතුගම ආදාහනාගාර භූමිය තුළ ආදාහන කටයුතු සඳහා පැමිණෙන පිරිසට වර්ෂාවෙන් ආරක්ෂා විමට මෙන්ම සංග්‍රහ කටයුතු වලදී ඊට පහසුව සළසා ගැනිම සඳහා 30’x20’ ගොඩනැගිල්ලක් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණි මහතා**

ආදාහනාගාර සම්බන්ධ යෝජනාව ඉතා හොඳ යෝජනාවක් යැයි අදහස් දක්වන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-9.7 මතුගම බටහිර පළාත් පාලන ආයතනයට අයත් 805සී, 805ඊ හා 805ඒ ග්‍රාම සේවා වසම් වල සියළු කුඹුරුවල දෙපා ශුද්ධ කර එම කුඹුරු වල අමුණු හා සම්බන්ධ ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් පැහැදිලි කරමින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ඊ-10 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-10.1 බෝපිටිය කොට්ඨාසයේ අතුරු මාර්ග වල තණකොළ කපා එළිපෙහෙළි කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-10.2 තඹරුටිය ප්‍රජා ශාලාව ලඟ ඇති මාර්ගය දැඩිලෙස අබලන් වී ඇති බැවින් එය පිළිසකර කිරිම හා එම ස්ථානයේ ඇති ක්‍රිඩා පිටිය එළිපෙහෙලි කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් පැහැදිලි කරමින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ඊ-11 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-11.1 අංක 12 ඉදිගස්තුඩුව කොට්ඨාසයේ වරකාතොල්ල ඉදිගස්තුඩුව නුගගහලන්ද යන ග්‍රාම සේවා වසම් වල පදිංචිකරුවන්ගේ ඉඩම් සඳහා මේ වන තෙක් ඉඩම් ඔප්පු ලබා දී නොමැත. එම ඉඩම් සඳහා නිත්‍යානුකූල ඔප්පු ලබාදිමට කටයුතු සලසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-11.2 අංක 12 ඉදිගස්තුඩුව මැතිවරණ කොට්ඨාසයේ සහ අනෙකුත් යාබද කොට්ඨාස වල ජීවත් වන ජනතාවට පානීය ජලය නොමැති බැවින් ඉතා දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටියි. එම ජනතාවට කුමන ආකාරයෙන් හෝ පානිය ජල ව්‍යාපෘතියක් ලබාදිමට සභාවට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා**

කළුතර LRC සම්බන්ධ කරගෙන කොට්ඨාසයට ඇවිල්ලා මේ අහිංසක මිනිසුන්ගේ ඔප්පු ලබා දිමට කටයුතු කිරිමට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්වත් සම්බන්ධ කරගෙන ඔප්පු ලබාදිමට කටයුතු කිරිමටත්,

පානිය ජල ප්‍රශ්නයඉතා බරපත ප්‍රශ්නයක් වෙලා තියෙනවා මේ දිනවල. කෙත්හේන ජල ව්‍යාපෘතිය හැකි ඉක්මණික් ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිමින් ඉහත යෝජනා සම්බන්ධයෙන් පැහැදිලි කරමින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මේ යෝජනාව හා සමාන යෝජනාවක් මමත් ඉදිරිපත් කරලා තියෙනවා. මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රජයේඉඩම් වල පදිංචි ස්ථිර නිවාස සහිත පදිංචි බොහොමයක් දෙනා ඉන්නවා ඉඩම් ඔප්පුවක් නැහැ. ඇතුලත්මුදලිගම LRC ඉඩම් වල පදිංචි අය වෙත ඔවුන්ට ඔප්පු නැහැ. ඔවුන්ට දරුවන් ඉස්කෝලේ දා ගන්න බැහැ. මතුගම නගරයෙන් පිටත රජයේ ඉඩම් වල බොහොමයක් දෙනාට ඔප්පු නැහැ. මේ හා සමාන යෝජනාවක් මම ඉදිරිපත් කරලා තියෙනවා LRC හෝ රජයේ ඉඩම් වල ඉන්න ස්තිර නිවාස වල ඉන්න අයට බලපත්‍රයක්, ඔප්පුවක් හෝ ප්‍රධාන පත්‍රයක් ලබාදිමට වහාම කටයුතු කරන්න කියලා මැදිහත්විමකින් ආණ්ඩුවේ ඉන්න ආයතන ප්‍රධානින්ටදැනුම්දිමක් කරන ලෙද විශේෂයෙන් ගරු කෘෂිකර්මාන්ත, ඉඩම් හා පශු සම්පත්, වාරිමාර්ග අමාත්‍යා කේ.ඩී. ලාල්කාන්ක මැතිතුමාගේ සහ සම්බන්ධීකරණ කමිටුවේදී කතා කරන්න ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව රණසිංහ මැතිතුමාට දන්වා යවන්න මතුගම ප්‍රාදේශීය සභාවේ මේ වගේ යෝජනාවක් සාකච්ඡා කළා ඒ ප්‍රශ්නෙන් ඒ අය මුදවා ගැනිම සඳහා වහාම මේ බලධාරින් දැනුවත් කරන ලෙස තමයි මම යෝජනා කරලා තියෙන්නේ. ***මා විසින් ඉදිරිපත් කරන ලද ඊ-18.2 යෝජනාව ඉල්ලා අස්කරගන්නා බව දන්වා සිටිමි.***

පානිය ජල ප්‍රශ්නය ගැන කතා කරා ඉන්දියානු රජයත් එක්ක නව රජය ආවායින් පසුව සාකච්ඡා කරලා තමයි මයි ඉන්දියන් රජය මෝදි අගමැතිතුමාගේ ආධාර අරගෙන තමයි නැවත මේ ව්‍යාපෘතිය ආරම්භ කරේ. අපේ ප්‍රදේශ වල ඉල්ලපු ගමන් ජලය ලැබෙනවා නමුත් ඔබතුමාගේ ප්‍රදේශයේ මොකක්ද වෙලා තියෙන්නේ කියලා හොයලා බලමු යැයි අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

ප්‍රධාන මාතෘකා දෙකක් තමයි එකක් තමයි පානිය ජල ප්‍රශ්නය ගැන කතා කලොත් මතුගම සිට ඕවිටිගල දක්වා ගෙවල් තියෙන සිමාව වෙනකන් ජල නල දාලා තියෙනවා මං හිතන්නේ. එතනින් එහා වැලිපැන්නට දාලා නැහැ. වැලිපැන්නේ ඉදලා දාලා තියෙනවා අධිවේගී පිවිසුම ගාවට මාර්ග ව්‍යාපෘතියට පාඩුවක් වන නිසා ඒ වෙලාවේ දැම්මා. ලාල් මන්ත්‍රිතුමාගේ යෝජනාවේ හැටියට පානිය ජලය ගැන හිතනන්වත් බැහැ තාම. දක්ෂිණ අධිවෙගී මාර්ගය ඉදිකිරිමේ දී භූගත ජලය ඇද්දා බට දාලා. අපට තාම දැනගන්න නැහැ අපේ ප්‍රදේශවලට ජලය ලැබෙන්නේ කවදාද කියලා. මේ ව්‍යාපෘතිය වෙනුවෙන් දිගු කිරිම් වලට සල්ලි දාලා තියෙනවා ජල ව්‍යාපෘතිය සම්බන්ධ අය ගෙනවලා සාකච්ඡාවක් කැදවන මෙන් ඉල්ලා සිටින ලදී.

ඔප්පු සම්බන්ධව කතා කරද්දි. කාටද දැන් නියමාකාරව ඔප්පු ලබා දිලා තියෙන්නේ මොනවද අඩුපාඩු කියලා හදුනාගෙන ඇමතිතුමාට ජනාධිපතිතුමාට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරිමට සුදානම්. මෙය හැම ආණ්ඩුවකටම එන ප්‍රශ්නයක්. එයට අදාල නිලධාරින් කැඳවලා සාකච්ඡාවක් සුදානම් කරන්න යැයි අදහස් දක්වන ලදී.

*ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා විසින් ප.ව. 2.30ට සභාවෙන් පිටව යන ලදී*

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජගත් විමලසිරි මහතා**

මගේ කොට්ඨාසයේ ජනතාව විශාල ලෙස පිඩාවට පත් වෙනවා මේ ජල ප්‍රශ්නය නිසා යම් කිසි අවධානයක් යොමු කරන අවසථාවක ඒ සම්බන්ධවත් අවධානය යොමුකරන ලෙස අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

බෝපිටිය පාසල අසල සිට සොල්දර කඩය හන්දිය අසල මෙහා මාර්ගයේ ජල නල එළිම සිදු නොවු බව අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ පිළිබඳව සංවර්ධන කමිටුවේ දී සාකච්චා කරලා සභාපතිතුමා පොරොන්දු වෙලා තියෙනවා ඒ ටික යාවත්කාලින ලෙස බට ලයින් ටික දාන්න. මේ යෝජනා දෙකම මම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවටත්, දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවටත් සමස්ථ යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන්නම් යැයි අදහස් දක්වන ලදී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

බෝපිටිය කොට්ඨාසයට අයත් දෙබරබැදිහේන කන්දේ ජනතාවට ඉතාමත් ජල හිගයක් පවතිනවා ඒක ලොකු ගැටළුවක්. ජල නල එළිමේ දී තාක්ෂණික ගැටළුවන් හේතුවෙන් මේ ප්‍රදේශයට ගිහිල්ලා නැහැ. තාක්ෂණ නිලධාරින් යොදාගෙන යෝජනාවක් ඉදිරිපත්කරන මෙන් ඉල්ලමින් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා**

ටැංකි කිහිපයක් සපයලා ඒ සඳහා ජල බවුසරය මගින් ජලය ලබාදෙන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ප්‍රදේශ හදුනාගන්නේ නැතුව ජලය ලබා දිම නිසා මේ සම්බන්ධව ජනතාව අපහසුතාවයට පත්වෙලා තියෙනවා. අවශ්‍යතාවය මත නෙමෙයි සංවර්ධන කටයුතු සිදු කරලා තියෙන්නේ යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරව්ල සමිතවංශ හිමි**

නාරවිල කොට්ඨාසයේ LRC ඉඩම් අක්කර 600ක් විතර තියෙනවා. විල්මට් පෙරේරාගම ඉන්නවා පවුල් 90ක් විතර ඔප්පු නැතුව. LRC එකේ නිලදාරින් කැඳවුවහොත් විල්මට් පෙරේරාගම හා කන්දහේන ප්‍රදේශයේ ජනතාව සම්බන්ධයෙන් අවධානය යොමු කරනමෙන් අදහස් දක්වන ලදී.

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමන් ප්‍රසාද් මහතා විසින් ප.ව. 2.40ට සභාවෙන් පිටව යන ලදී.***

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොන් සීමන් රාලලාගේ දුමිදු චතුර සම්පත් මහතා ප.ව. 2.40 ට පමණ නැවත සභාව වෙත පැමිණි අසුන් ගන්නා ලදී.***

**ඊ-12 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-12.1 මතුගම නගර මධ්‍යයේ ඉදිකර ඇති උමං මාර්ගය භාවිතා කරන්නේ ඉතා සුළු පිරිසක් බව නිතරම පෙනි යන කරුණකි. එම නිසා අනතුරු සිදුවිමට ඇති ඉඩකඩ වැඩි බවක් පෙනේ. එය අවම කර ගැනිම සඳහා සුළු දඩ මුදලක් අයකර ගැනිම සිදු කල යුතු බව ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-12.2 බස් නැවතුම් පොළ හා ඒ අවට පරිසරය පුරා බුලත් කෙළ ගසා අපිරිසිදු වන බැවින් ඒ සඳහා සුළු දඩ මුදලක් අය කිරිමෙන් එය සිදුවිම අඩුකර ගතහැකි වනු ඇතැයි මා සිතමි. එම නිසා එය ගැන සලකා බලන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-12.3 මතුගම පුරවරේ හා ඒ අවට ඇති පෞද්ගලික හා පුද්ගලික පාසල් හා ආයතන වල ගොඩනැගිලි හා විද්‍යුත් පද්ධති ප්‍රමිතියෙන් තොර ස්ථාන රාශියක් ඇති හෙයින් එමගින් සිදුවිය හැකි හා හානියද විශාලය එය අවම කරගැනිමට ඊට සුදුසු නිලධාරින් හරහා තත්ත්ව පරික්ෂාවක් කර ඊට සුදුසු ක්‍රියමාර්ග ගැනිමට වැඩ පිළිවෙලක් සකසන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**ඊ-12.3 යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මිය විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී.**

ඊ-12.4 මතුගම ආසනයේ තිබෙන සියලුම ග්‍රාමීය පාරවල් වල විවිධ ගැටලු වලින් පිරි ඇති බවක් පෙනේ ඉන් ප්‍රධානම ගැටලුව තමා අනවසර ඉදිකිරිම් හා මායිම් සඳහා සිටුවා ඇති ගස් වැටවල් ගලවා ඉවත් කරන ලෙසත් ඊට සුදුසු මායිමක් ලකුණු කිරිම මගින් මහජනතාවට සිදුවන කරදර අඩු කර ගැනිමට හැකිවනු ඇති හෙයින් එ ගැන සලකා බලන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-12.5 ඒ වගේම නාගරික හා ග්‍රාමීය කොට්ඨාස වල තිබෙන කාණු පද්ධති විවිධ හේතුන් මත අක්‍රිය වි ඇති බව පෙනේ සමහර ස්ථාවල කාණු පද්ධතිය වතුවලට අරන් තාප්ප දමා ඇති ස්ථාන ද තිබේ. කාණුවල බෝක්කු වල පස් පිරිලා පාරවල් හරයා ජලය බැසයන තැන්

තිබේ. (වැසි දිනවල විශේෂයි) එම නිසා ඒවා ප්‍රතිසංස්කරණය කරන මෙන්ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චන්දිමා රුචිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-12.6 මේ අවට ඇති සියළු පාසල් ඉදිරි පිට දැනුවත් කිරිමේ පුවරු හා වේග සීමා කළකුණු ස්ථාපිත කරන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චන්දිමා රුචිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-12.7 විවිධ ගම් වලින් නගරයට පැමිණෙන ළමුන්ගේ ආරක්ෂාවට උදැසන 6.30 සිට 8.00 දක්වාත් දහවල් 1.30 සිට 6.00 දක්වාත් විදිමත් වැඩ පිළිවෙලක් සැකසිම සිදු කළයුතු බව පෙනි යයි. ඒ ගැන ද සලකා බලන මෙන් ගරු සභාවට යෝජනා කරමි. (එය සෙනසුරාදා ඉරිදා වැනි පන්ති පැවැත්වෙන වේලාවන් ආවරණය වන සේ)

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චන්දිමා රුචිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-12-8 802/බී යටදොල බටහිර ග්‍රාම සේවා වසමේ විදුලි බලාගාරය අසල ඇති පොදු ළිද පිලිසකර කර ජනතාවට භාවිතයට සුදුසු පරිදි සකසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චන්දිමා රුචිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දුලන්ත වික්‍රමනායක මහතා**

උමං මාර්ගය අසල පොලිසිය රැදී සිටිනවා.නමුත් ඔවුන් නැති වෙලාවට තමයි උමං මාර්ගය වෙනුවට මාර්ගය භාවිතා කර පාර මාරුවෙන්නේ ඒ නිසා මම හිතනවා කලර් ලයිට් සිවිකිරිම සුදුසුයි කියාලා. මම යෝජනා කරනවා පවතින ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මේ කලර් ලයිට් සෙට් එකක් මේ සඳහා ස්ථාපිත කරන්න අවස්ථාවක් තිබුණොත් මේ ප්‍රශ්නය මහැරෙනවා. මෙතුමිය ගෙනා මේ යෝජනාව සම්බන්ධයෙන් මම කියා සිටින්නේ මතුගම නගරයට අත්‍යවශ්‍ය කාරණාවක් තමයි මේ වේග සිමා හා කලර් ලයිට් සිස්ටම් එකක මේ නගරය අවශ්‍යයි යෝජනා කරමින් අදහස් දක්වන ලදී.

**ඊ-13 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-13.1 මතුගම ගලබඩයාවත්ත පාරේ සමෘද්ධි ළිඳ අසලින් ඇති අතුරු මාර්ගය කොන්ක්‍රිට් දමා සකස් කිරිමට අඩි 10ක් පළලට සහ පාරේ දුර ප්‍රමාණය මිටර් 100කි එය සංවරර්ධනනය කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්. රුවන්ති වාසනා රත්නායක මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මියගේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ-13.2 යට්ටෝවිට වැකඩ විල පාර හොඳටම අබලනව්ව ඇති මාර්ගයකි. පාරේ කොටසක් කොන්ක්‍රිට් අතුරා ඇත. ඉතිරි කොටස අඩි 10 පළල හා මිටර් 120දුර ප්‍රමාණය කොන්කක්‍රිටට් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්. රුවන්ති වාසනා රත්නායක මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මියගේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**ඊ-14 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-14.1 මතුගම නගරයේ සුදුසු ස්ථානයක් තෝරාගෙන සහා අරමුදල් හෝ වෙළඳ ආයතනයක් සම්බන්ධ කර ගනිමින් ඩිජිටටල් තිරයක් නිර්මාණය කිරිම සුදුසු යැයි ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මියගේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ-14.2 සෑම ඉරිදා දිනකම පෙ.ව. 8..00 සිට පස්වරු 1.00 දක්වා පැවැත්වෙන උපකාරක පන්ති හේතුවෙන් ඉරුදින පැවැත්වෙන දහම් පාසල් කටයුතු සිදු කරගෙන යෑම දැඩි දුෂ්කරතාවන් ඇති වී ඇති බැවින් ඒ සඳහා ඉරිදා දින පෙ.ව. 8.00 සිට ප.ව. 1.00 දක්වා කාලය තුළ ටියුෂන් උපකාරක පන්ති සිදු කිරිම තහනම් කරමින් යෝජනාවක් සම්මත කර උපකරක පන්ති ගරුවරුන් හා පළාත් ආණ්ඩුකාරතුමා දැනුවත් කිරිම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මියගේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ-14.3 මතුගම සහා බල ප්‍රදේශයේ අත්‍යාවශ්‍ය ස්ථාන සඳහා මන්ත්‍රීවරුන්ගෙන් තොරතුරු සොයා බලා එම ස්ථාන සඳහා නම විදුලි පහන් සවිකිරිමට සහා ප්‍රතිපාදන මුදලක් අනුමත කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මියගේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

නගරය පුරාම බැලුවාම උපකාරක පන්ති ගුරුවරුන්ගේ විවිධ කට්ටියගේ දැන්වීම් පුවරු නිසා ලස්සන මතුගම කියන ඔබතුමාගේ අදහස සාර්ථක කර ගන්න පුළුවන් යෝජනාවක් ලෙස මම මේ යෝජනාව දකිනවා. දැන්වීම් පුවරු මාපියාව වෙනුවෙන් හොඳම විසඳුමක් ලෙස මම දකිනවා. මේ සඳහා සභාවේ අරමුදලක් යොදවලා හරි එහෙම නැත්නම් යම්කිසි වෙළඳ ආයතනයක අනුග්‍රහයක් අරගෙන ඒ අනුගහයන් අවශ්‍යනම් යටින් දාලා ආයතනයේ ප්‍රජා සත්කාරයක් කියලා සභාවේ ඉල්ලීම පරිදි මතුගම නගරයේ සුදුසු ස්ථානයක් තොරගෙන ඩිජිටල් දැන්වීම් පුවරුවක් සකස් කිරිමෙන් සභාව ආදායමක් ගෙන එන මාර්ගයක් බව අදහස් කරන ලදී.

පෙ.ව. 8.00 සිට ප.ව. 1.00 දක්වා ඉරිදා දින වල උප කාරක පන්ති පැවැත්වීම සම්බනධව උපකාරක පන්ති ගුරුවරු හා ආයතන ප්‍රධානින් කැඳවලා සාසනාරකෂක බල මණ්ඩලයේ සභාපති හාමුදුරුවොත්, ලේකම් හාමුදුරුවාත් කැඳවලා මේ පිළිබඳව සුහද සාකච්ඡාවක් කරමු යැයි අදහස් දක්වන ලදී

අත්‍යාවශ්‍ය ස්ථාන පිළිබඳව සොයා බලා විදි ලාම්පු සවිකිරිමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර දෙන ලෙස අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජගත් විමලසිරි මහතා**

විදි ලාම්පු ජනාකීර්ණ බව නොසලකා ආරක්ෂාව ගැන සලකා පාළු ස්ථාන වල වුණත් විදි ලාම්පු සවිකරදෙන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය**

ඊ-14-1 හා ඊ-14.2 යෝජනා සම්බන්ධව ඩිජිටල් තිරයක් සකස් කර එම සේවාව ලබාගැනිමට උපකාරක පන්ති ගුරුවන් කැමැත් ඇති බව ප්‍රකාශ කරන ලදී.

ඒ වගේම ඉරිදා දින උපකාරක පන්ති පැවැත්විම සම්බන්ධ යෝජනාව පිළිඳව වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනෙත් ප්‍රියංකර මහතා**

යටදොලවත්ත පහල පාරේ පාලමට එහා පැත්තේ තියෙන විදුලි කනුවේ බල්බය හදන්නේ නැතුව අනෙක්වා හදනවා යැයි චෝදනාවක් ගමේ මිනිසුන්ගෙන් තියෙනවා. එබැවින් එය සකස් කර දෙන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ ලයිට් එක හදලා නැති එක ගැන මම හෙටම හොයලා බලන බව අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා**

අළුතෙන් ලයිට් නැති වුණත් දිරාපත් වුණ ලයිට් තියෙනවා කොට්ඨාස තුළ ඒ ගැන අවධානය යොමු කරන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

විදුලි බිලක් හදනවා මේ වෙද්දි බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට ලක්ෂ 18ක බිලක් හදලා එවලා තියෙනවා මේ වන විට. අපිට ලක්ෂ 30ක 40ක බිල් එකක් එවුවොත් අපි කොහොමද ඒ බිල ගෙවන්නේ, අපිට ලයිට් දාන එක කෙසේවෙතත් ලයිට් ගලවන්නයි

සිද්ධවෙන්නේ. ඒ නිසා මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගන්න කාලය දෙන්න ඊට පස්සේ හැමෝටම ලයිට් දෙනවා හැමෝටම යැයි අදහස් දක්වන ලදී.

හාමුදුරුවෝ ගෙනා පළමුවෙනි යෝජනාව අපි ඉදිරියේ දී ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තුවෙන් ඉන්න බව අදහස්කරන ලදී.

මුලින්ම ටියුෂන් ගුරුවරුන් කැඳවලා ඔවුන් සමඟ සාකච්ඡාකරලා ආණ්ඩුකාර තුමත් ඒ සියළු දෙනා දැනුවත් කර මෙය ක්‍රියාත්මක කරන්න ඉදිරි කාලසීමාව තුළ ක්‍රියාත්මක කරන බව අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා**

අද මගේ කොට්ඨාසයේ විදි ලාම්පු අළුත්වැඩියා කරනවා කොට්ඨාසයේ මන්ත්‍රීවරයා හැටියට මම දන්නේ නැහැ මාව ඒ සම්බන්ධව දැනුවත් කරලා නැහැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

අපේ කණ්ඩායම් රැස්විම දවසට තමයි අපි ලයිට් වලට යන දින තීරණය කරන්නේ ඒ නිසා කණ්ඩායම් රැස්විමට සහභාගී වන අය දන්නවා ලයිට් වලට යන දිනය හා කොට්ඨාස සම්බන්ධව. ඔබතුමා ඉදිරිපත් කර ඇති විදි ලාම්පු අළුත්වැඩියා කිරිම් සියල්ල මේ වන විට සිදු කරලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමන් ප්‍රසාද් මහතා**

හේනේගම නාරවිල දියගල යන වසම් තුනටම අදාලව වැඩ නොකරන විදි ලාම්පු පිළිබඳව ලේඛනයක් අපි ලබා දුන්නා. නමුත් විදි ලාම්පු අළුත්වැඩියා කරන දිනය පිළිබදව අපිව දැනුවත් කිරිමක් නැහැ ඒකට කමක් නැහැ. අපට වැඩේ හරියට වෙන්නයි ඕන. නමුත් අපේ රැස්විම් තියපු ස්ථාන වල විදි ලාම්පු සවි කරලා නැහැ. ඒ පිළිබඳව ඔබතුමාට දුරකථන ඇමතුම් ලැබෙන්න ඇති. සමහර විට ඔබතුමා දැනුවත් නැතුව ඇති. මම ඔබතුමාට චෝදනා කරන්නේ නැහැ. එහෙම වෙනකොට ඔබතුමා තමයි අපහසුතාවයට පත්වෙන්නේ යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජා නාරවිල සමිතවංශ හිමි**

මම ඔබතුමාගෙන් දින තුනක් ඉල්ලගෙන කොට්ඨාසයේ ලයිට් බහුතරයක් හදලා අවසන් කරා. දැනට සභාපතිතුමා එක් දිනකට ලයිට් 24යි ලබා දෙන්නේ. එතකොට අපි ලයිට් 24 සිමාව තුළ ඉදලා තමයි අපි ලයිට් හදන්නේ. බිග් සිටිඑකේ කුසුම් මහතාගේ නිවස අසල ලයිට් එක වෙන්න ඇති මේ කියන්නේ මටත් ආරංචිය ආවා කිසිසේත්ම එහෙම කරන්නේ නැහැ. අපිට අදාල නැහැ ඒක. මම හාමුදුරු කෙනෙකු හැටියටත් මම කිසිසේත්ම මට ඡන්දය දුන්නද නැද්ද යන්න භේදයක් නැහැ. සියළු දෙනාට සමසේ උදව් කරනවා. සභාපතිතුමාව අපහසුතාවයට පත්කරන්නත් බැහැනේ කොට්ඨාසයට ලයිට් දිලා ඒ නිසා මෙලෙස පැහැදිලි කිරිම කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා**

මගේ කොට්ඨාසයට ලයිට් හයිකරන්න ආවාම පක්ෂ විපක්ෂ සියළු ස්ථාන වල අපි ලයිට් සවිකරන ලද බව අදහස් දක්වන ලදී.

**ඊ-15 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. විජිතා ද සිල්වා මහත්මියගේ විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-15.1කිරන්තිඩිය සමගි මාවත පිවිසුමේ සිට ඉදිරියට තාර යොදා සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. විජිතා ද සිල්වා මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-15.2 කීරන්තිඩිය මදුවැල්කොටුන්න ප්‍රධාන පිවිසුම් මාර්ගය යන්ත්‍රානුසාරයෙන් පිළිසකර කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. විජිතා ද සිල්වා මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-15.3 කීරන්තිඩිය බෝධිය අසල අළුත්හේන මාර්ගය අබලන් වූ බෝක්කුව අළුත් වැඩියා කිරිම සහ පාර ඩෝසර් කර සැකසිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. විජිතා ද සිල්වා මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-15.4 කීරන්තිඩිය ආදර්ශ ගම්මානය අතුරු මාර්ගය කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. විජිතා ද සිල්වා මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-15.5 අනිල් මුණසිංහගම අතුරු මාර්ගය කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍ර්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. විජිතා ද සිල්වා මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. විජිතා ද සිල්වා මහත්මිය**

ඉහත යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කරමින් අදහස් දක්වන ලදී.

**ඊ-16 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.එම්. රම්සාන් මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-16.1 793ඒ නැ/ වැලිපැන්න දකුණ ග්‍රාම නිලධාරි වසමේ මුල්කැටිය ප්‍රදේශයේ පිහිටි ළමා හා මාතෘ සායනය නැවත එම ස්ථානයේ ම පවත්වාගෙන යාමට කටයුතු කරදෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.එම්. රම්සාන් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-16.2 793බී නැ/ වැලිපැන්න උතුර ග්‍රාම නිලධාරි වසමේ හිජ්රා මාවත කහටගහහේන මුස්තෆා මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.එම්. රම්සාන් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-16.3 793බී නැ/ වැලිපැන්න උතුර ග්‍රාම නිලධාරි වසමේ පල්ලිය පාර ජුම්මා පල්ලිය අසල වංගුවේ සිට ‘‘ඔඩේතොර‘‘ තොටුපල දක්වා එක් පැත්තකින් කාණුව කපා රියාස් මවුලව් තුමාගේ නිවසට ඇතුල්වන ස්ථානයේ කැඩී ඇති බෝක්කුව නැවත දමා ජලය බැසයාමට කටයුතු කර දෙන මනේ ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.එම්. රම්සාන් මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.එම්. රම්සාන් මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කරමින් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ සම්බන්ධයෙන් සංවර්ධන කමිටුවේදී දීර්ග වශයෙන් සාකච්ඡා කළා. හැකි ඉක්මණින් මේ සමබන්ධව විසඳුමක් ලැබේවි යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.එම්. රම්සාන් මහතා**

ජනතාව කියනවා ආණ්ඩුව එක්ක සම්බන්ධ වෙලා ළමා හා මාතෘ සායනය ලබාදෙන්න කියලා. මට ආරංචියක් ආවා සංජීව මන්ත්‍රීතුමා සම්බන්ධිකරණ කමිටු රැස්විමේදී කතා කළා කියලා.

**ඊ-16 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-16.1 ධර්මපාලගම අඩක් නිම වී ඇති ජල ව්‍යාපෘතිය සම්පූර්ණ කර ජනතා අයිතියට පත්කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-16.2 පල්ලවත්ත සුරේෂ් මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කරදෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-16.3 පල්ලවත්ත ධර්මපාලගම මාර්ගය සංවර්ධනය කරදෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-16.4 ධර්මපාලගම දෙවන අතුරු මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කරමින් අදහස් දක්වන ලදී.

**ඊ-17 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-17.1 802ඒ බෝපිටිය බටහිර බෝගහවත්ත අතුරු මාර්ගය සංවර්ධනය කර දෙනමෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-17.2 802 බෝපිටිය නැගෙනහිර ශ්‍රී සෝමපාල මාවතේ අතුරු මාර්ය සංවර්ධනය කරදෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

ඉහත යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කරමින් අදහස් දක්වන ලදී.

**ඊ-18 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-18.1 මතුගම අගලවත්ත ප්‍රධාන මාර්ගයේ වැත්තැව රජයේ රෝහලට ඇති බස් රථ නැවතුමේ සිට අගලවත්ත දෙසට ඉදිරියට ඇති නිවිතිගල කැලේ මාර්ගය දක්වා වූ ප්‍රධාන මාර්ගය වංගු රහිතව පිහිටි මාර්ගයක් බැවින් රථ වාහන රියැදුරන් නිරන්තරයෙන් මෙම මාර්ග කොටසේ අධික වේගයෙන් වාහන ධාවනය කරන අතර ඇති විය හැකි අනතුරු අවධානමක් දැඩිව පවතී. එසේ හෙයින් මෙම මාර්ග කොටසේ අනතුරු අවධානම වළක්වා ගැනිම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කොට SPEED BREAKERS නැමැති මාර්ග බාධකය යෙදිමට මෙම ප්‍රාදේශීය සභාව මැදිහත්ව කටයුතු කළයුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-18.2 මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රජයේ ඉඩම් වල කලක් තිස්සේ ස්ථිර නිවාස ඉදිකරගෙන පදිංචිව සිටින නමුත් මෙතෙක් කිසිදු ඔප්පුවක් දිමනා පත්‍රයක් සහ/හෝ ප්‍රදාන පත්‍රයක් ලැබී නොමැතිව සිටින ජනතාව වෙනුවෙන් පදිංචි ඉඩම් කොටසේ අයිතිය ලබාදිම සඳහා සුදුසු වැඩ පිළිවෙලකට ඔවුන්ව යොමු කරවන ලෙස ගරු කෘෂිකර්ම, ඉඩම් හා පශු සම්පත්, වාරිමාර්ග අමාත්‍යා කේ.ඩී. ලාල්කාන්ත මැතිතුමාගේ සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව රණසිංහ මැතිතුමාගේ අවධානයට යොමු කරවිම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

**ඊ-18.2 යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා විසින් ඉල්ලා අස්කරගන්නා ලදි.**

ඊ-18.3 මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 805 මතුගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ බණ්ඩාරනායක මාවත හා ආදාගල හරස් මාර්ගය යාකරන පටු මග මධ්‍යයේ පිහිටි මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමයේ චමිල පියරත්න මහතාගේ නිවසට යා බඳව ඇති කිසිවකුත් භුක්ති නොවිඳින පර්චස් 03ක පමණ බිම් කොටස ප්‍රදේශවාසීන්ගේ වාහන නැවැත්විමේ හා හැරවිමේ ස්ථානයක් ලෙස සංවර්ධනය කර ගැනිම සඳහා ලබා දිමට ඇති හැකියාව සලකා බලන ලෙස කළුතර දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිධන් සභාවේ අධ්‍යක්ෂ වෙත සහ මතුගම ප්‍රාදේශිය ලේකම්වරයා දැනුවත් කිරිමට කටයුතු කළයුතු බවට මෙම සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-18.4 මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශීයේ මතුගම නගර මධ්‍යයේ සිට සිව් දෙසට විහිදෙන ප්‍රධාන මාර්ග හතර දෙපස කිලෝමීටර් එකහාමාරක් දක්වා වූ ප්‍රදේශය ඇතුලත අළුතින් මාලු වෙළදාම සහ එළවළු වෙලදාම සඳහා කිසිදු ආකාරයක අවසර පත්‍රයක් (වෙළඳ බලපත්‍රයද, පරිසර බලපත්‍රයද ඇතුළුව) සහ/හෝ අනුගහයක් මෙම ප්‍රාදේශීය සභාව මගින් මින් ඉදිරියට ලබා නොදිය යුතු බවට වන යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන අතර එකි වෙළදාම් ලොරි රථ හෝ වෙනත් රථ මත තබාගෙන සිදුකරන ජංගම වෙළදාම් ද වහාම

ක්‍රියාත්මක වන පරිදි තහනම් කටයුතු ලෙස සලකා ක්‍රියා කළයුතු බවට වැඩිදුරටත් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-18.5 මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මතුගම යටදොලවත්ත ප්‍රදේශයේ අංක 93 දරණ ස්ථානයේ ආරම්භ කිරිමට යෝජිත මත්පැන් අලෙවි සැල එකී ස්ථානයේ හෝ යටදොලවත්තේ වෙනත් කිසිදු ස්ථානයක පිහිටුවිම සම්බන්ධව මෙම සභාවේ පූර්ණ විරෝධතාවය ප්‍රකාශ කළයුත් බවට වූ යෝජනාව ඉදිරිපත් කරන අතර, එකී මත්පැන් අලෙවි සැල මෝ වෙනත් කිසිදු ආකාරයක මත්පැන් අලෙවි සැල් මතුගම ප්‍රාදේශීය සභා බල සිමාව තුළ කිසිදු ස්ථානයක මින් ඉදිරියට ස්ථාපනය කිරිමට ඉඩ ලබා නොදිය යුතු බවටද, යටදොලවත්තේ යෝජිත මත්පැන් අලෙවි සැලට හෝ මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙනත් කිසිදු මත්පැන් අලෙවි සැල් සඳහා මින් ඉදිරියට වෙළඳ සහ/ හෝ පරිසර බලපත්‍ර නිකුත් කිරිම සහ ඊට අදාල වෙනත් කිසිදු අවසර පත්‍රයක් නිකුත් කිරිම සහ/හෝ අනුබල, ආධාර ලබා දිම මෙම ප්‍රාදේශීය සභාව විසින් නොකළ යුතු බවද ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා විසින්**

මෙම මාර්ගයේ තියෙන අවධානම හඳුනගෙන මෙම මාර්ගයේ තියෙන අනතුර මගහරවා ගැනිම සඳහා මතුගම ප්‍රාදේශීය සභාවේ අපි ඒ තත්ත්වය මගහරවා ගැනිම සඳහා SPEED BREAKERS ක්‍රමයට මාර්ග බාධක යොදන ලෙසට යෙදිම සුදුසු බවට යෝජනා කරලා මාර්ග සංවරධන අධිකාරිය වෙතට ලිපියක් මගින් ඉදිරිපත්කලයුතු බව අදහස් කරන ලදී.

ඒ වගේම සභාපතිතුමනි චමිල පියරත්න මහතාගෙ නිවස අසල පර්. 3ක ඉඩම් කැබැල්ල ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාවට එම ඉඩම් කොටස ජෙද්ශවාසි ජනතාවගේ පරිහරණය සඳහා වෙන්කර දෙන ලෙස මතුගම ප්‍රාදේශීය ලේකම්වරයා හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දැනුවත් කරන ලෙස අදහස් දක්වන ලදී.

එළවළු ලැලී මාළු ලැලී ඕනතරම් තියෙනවා මතුගම නගරයේ. මේ සඳහා වෙළඳ බලපත්‍ර හා පරිසර බලපත්‍ර ලබානොදෙන ලෙස යෝජනා කරන අතර, මතුගම ප්‍රාදේශීය සභාවටයි මම යෝජනාව ඉදිරිපත් කරන්නේ. ප්‍රාදේශිය සභා බල සිමාව තුල මේ කටයුතු සඳහා අවසර නොදිය යුතුයි යන්න අදහස් දක්වන ලදී.

කීර්තිමත් සංඝපිතෘවරයෙක් යටදොලවත්තේ අපේ චන්ද්‍රසිරි හාමුදුරුවෝ අපිට ලිපි මගින් දැනුම් දි තිබෙනවා මෙම සුරා හල සම්බන්ධයෙන් විරෝධය කීර්තිමත් ගමක් යටදොලවත්ත කියන්නේ මතුගම ප්‍රාදේශීය සභාවේ බිහිවුණු බොහෝ සභාපතිවරු මන්ත්‍රීවරු බිහිවුනේ යටදොලවත්තෙන්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇමතිවරු බිහිවුණු ගමක් යටදොලවත්ත කියන්නේ. මෙම මත්පැන් අලෙවිහල යටටෙදාලවත්තට ගෙන ඒම සම්බන්ධයෙන් අපි ඒකට විරුද්ධ වෙන්න ඕන. මම තමුන්නාන්සේලාට කියන්නේ යටදොලවත්ත ගමත් මුළු මතුගම ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුලේ අළුතින් මත්පැන් අලේසැල් විවෘත වෙන්න දෙන්න එපා මෙම යෝජනාව කවුරුත් එක්ක අනුමත කරලා

අපේ හාමුදුරුවන්න කරන ගෞරවයක් ගමේ නම්බුව නැතිකරගන්න එපා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

යටදොලවත්තට අළුත්, වහල තියපු එකක් ආයෙත් අරිනවා කියන එක නෙමෙයි. යදොලවත්තට අළුතෙන් ගෙනාපු යෝජනාවක්. වෙන තැනකට ලැබුණු පර්මිට් එක යටදොලවත්තට ගෙන ඒමට උත්සහ කරනවා. අපිට මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන් සිමාවක් ඇතුලේ විතරයි. මේක කරන්න ඕන පවතින රජයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා තමයි මේ සියල්ල සිද්ධවෙන්නේ. අපිට මේ වෙනකොට ඇවිල්ලා තියෙනවා ඒ බිල්ඩින් එක අනුමැතියට මේ වන විට ඒ අනුමැතිය දිලා නැහැ. නමුත් ඒ රුල්ස් වලට බිල්ඩින් එක හදලා තියෙනවා නම් අපිට අනුමැතිය නොදි ඉන්නත් බැහැ. මේක යටදොලවත්තට ගෙන ඒම සම්බන්ධයෙන් විරෝධතාවයක් තියෙනවා. නමුත් මේ සම්බන්ධයෙන් සභාවට වඩා පවතින ආණ්ඩුව අතේ කරන්න පුළුවන් කාරණාව තියෙන්නේ. නමුත් මේ කටයුතු සිදුවන්නේ පවතින රජය යටතේ. නමුත් සභාවක් හැටියට පක්ෂ විපක්ෂයෙන් තොරව මන්ත්‍රීවරු සියළුදෙනාම විරෝධතාවය තියෙනවා. එම විරෝධතාවය අදාල ආයතන වෙත දැනුම් දෙනවා.මහජන විරෝධතාවයක් ලෙස සලකා බලා මේක යටදොලවත්තේ ගම්වාසින් හැටියට මේක මෙතනට ගේන්න එපා කියන කාරණාව තුළ අපි දැඩිලෙස ඉන්නවා. මේ විරෝධතාවය ඉදිරිපත් කරලා රජයට බල කරනවා අපි මෙය මෙතනට ගේන්න එපා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොන් සීමන් රාලලාගේ දුමිදු චතුර සම්පත් මහතා මහතා**

ඔබතුමා ඉදිරිපත් කළ යෝජනාවටත් අපි එකගයි. නමුත් තවත් ප්‍රශ්නයක් තියෙනවා. ඔබතුමාලා ආණ්ඩු පක්ෂය නියෝජනය කරන නිසා කියන්නේ ගම්වල හැමතැනම කසිප්පු තියෙනවා ඒ සඳහා මැදිහත් වෙන්න ඉස්සෙල්ලාම යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ඒ සම්බන්ධව ස්ථිරවශයෙන්ම ඉදිරියේදී කටයුතු කරනවා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඊ-18.4 යෝජනාව අනුව අනවසර වෙළඳාමක් නම් අපට නවත්තන්න පුළුවන්ත කඩයක් අරගෙන මාළු කඩයක්, එළවළු කඩයක්, පළතුරු කඩයක් දානවානම් ඒක අපිට නවත්තන්න බැහැ. අපිට මෙය නවත්තන්න හැකියාවක් නැහැ. මොකද අපි මාළු කඩ ටෙන්ඩර් කරලා නැහැ. අපි ටෙන්ඩර් කරපු එකක් තියෙනවා නම් අපේ සභාව ඇතුළත ඒ ටෙන්ඩර් වලින් කාටහරි දිලා තියෙනවා නම් අපිට පුළුවන් ඒක කාටවත් නොදි ඉන්න. කඩයක් හැටියට දිලා තියෙන කඩයක මාළු කඩයක් පවත්වාගෙන යනකොට අපි තව තැනක කඩයක් දැම්මා කියලා නවත්තන්න හැකියාවක් නැහැ. පරිසර බලපත්‍රය ගන්නඅදාල ආයතනවලින් ඒ සම්බන්ධයෙන්අපිට ඒ කරලා ඒ නිවැරදි ක්‍රමයට ඒවා නගරයේ තියෙන අපේ සභාව සතු මාළු කඩවලට වඩා හොඳට ඒවා හදලා තියෙනවානම් අපි කොහොමද විරෝධතාවයක් දක්වන්නේ. අනවසර ඉදිකිරිම් ඉවත් කරන්න පුළුන් යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

මතුගම ප්‍රාදේශිය සභාව සතු භූමිවල පවත්වාගෙන යන වෙළඳසැල් තියෙනවා. මම දැනුවත්ව කඩයක් පවත්වාගෙන යනවා අවු. 9ක් තිස්සේ. ඒකට සභාවෙන් සම්බන්ධීකරණ කමිටුවෙන් අනුමැතියක් දිලා තියෙනවා. අපි දැන් කතා කරනවානේ සම්බන්ධීකරණ කමිටුවට අයිතියක් නැහැ කියලා සභාවේ දේපල සම්බන්ධ තීන්දු තීරණ දෙන්න ඇතැම්

තැන්වල දිලා තියෙනවානේ. පසුගිය කාලේ මම අහපු ප්‍රශ්නවලට අනුමැතිය දිලා තියෙන්නේ සම්බන්ධිකරණ කමිටුව. ශ්‍රවණාගාර භූමියේ වාහන අංගනයට අනුමැතිය දිලා තියෙන්නේ සම්බන්ධිකරණ කමිටුවේ. සභා පනතේ තියෙනවා සභාවේ භූමිවලට සම්පත් වලට කාටවත් තීන්දු තිරණ ගන්න බැහැ කියලා. ඒකට තීන්දු තීරණ දිලා තියෙනවා ඒවා ක්‍රියාත්මක වෙලා තියෙනවා. නමුත් ශ්‍රවණාගාර භූමියේම සෙල්ලම් බඩු කඩයක් පවත්වාගෙන යනවා මගේ කොට්ඨාසයේ එක්කෙනෙක් අවු 9ක් තිස්සේ. පෙර හිටපු ලේකම්වරයෙකුගේ අත්සනින් ගෙවීමක් කරන්න කියලා තාවකාලික පදනම මත තමයි දිලා තියෙන්නේ. ඒ වගේ මාර්ගයට අවහිර නොවන පරිදි වෙළඳ ස්ථාන පවත්වාගෙන යනවා. ඉවත් කරනවා නම් සියල්ලම අයින් කරන්න. නිතිය ක්‍රියාත්මක කරන්න නැතිනම් සභාව මැදිහත් වෙලා අයින් කරන්න එහෙමත් නැත්නම් සභාවට අදායමක් එන විදිහයට තාවකාලිකව මුදලක් හරි අයකරගනෙ කටයුතු කරන්න යැයි අදහස් දක්වන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මගේ යෝජනාවේ මම ඉදිරිපත් කලේ අළුතින් මාළුකඩ, එළවළු කඩ සඳහා අවසර නොදෙන ලෙස යැයි අදහස් දක්වන ලදී.

**ඊ-19 ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනගිපුර සමන්ත රෝහණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-19.1 798 කොටගෙදර මද්දෙගෙදර කැඩී ගිය බෝක්කුව සහ පාර කොන්ක්‍රිට් හෝ තාර දමා සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනගිපුර සමන්ත රෝහණ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-19.2 798ඒ කොලැකඩ පල්ලෙගොඩ වෙල්ගම ගම්මානයේ ප්‍රධාන පිවිසුම් මාර්ගය හා ක්‍රිඩා පිටිය සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනගිපුර සමන්ත රෝහණ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-19.3 774බී හේන්පිට රුක්ෂ දේවාල පාර තාර හෝ කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනගිපුර සමන්ත රෝහණ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනගිපුර සමන්ත රෝහණ මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කරමින් අදහස් දක්වන ලදී.

**ඊ-20 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.ඒ.ඩී. තිලිණි මධුෂානි සිරිවර්ධන මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-20.1 කොස්වත්තගොඩ මාර්ගයේ ප්‍රදේශවාසීන් ඉදිරිපත් කර ඇති අනවසර මාළු වෙළඳසැල් හා කඩ කාමර ඉවත් කර ගැනීම සම්බන්ධ ඉල්ලීම සලකා බලමින් සභාව සතු එම වෙළඳසැල් සුදුසු ආකාරයෙන් නියමිත පරිදි සකස් කර දෙන තුරු බදාදා සහ ඉරිදා යන පොළ පැවැත්වෙන දිනයන් හි එම මාර්ගය භාවිතා කරන්නන්ට ඒ සඳහා විකල්ප මාර්ග භාවිතා කරන ලෙසට ගරු සභාවට යෝජනා කරමි (භාවිතා කළ හැකි විකල්ප මාර්ග මද්දෙගොඩ පාර, මේධානන්ද මාවත, පස්කුවල් මාවත, ධර්මරාජ මාවත, නැබඩ පාරෙන් පිවිසෙන කොස්වත්තගොඩ පාර)

**ඊ-20.1 යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.ඒ.ඩී. තිලිණි මධුෂානි සිරිවර්ධන මහත්මිය විසින් ඉල්ලා අස්කරගන්නා ලදි.**

ඊ-20.2 802 බී යටදොලවත්ත බටහිර ග්‍රාම සේවක වසමට අයත් ජනඋදා ගම්මානයේ තුන්වන පටුමග මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.කේ. කාවින්දයා ඉඳුවරනි මෙනවිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.ඒ.ඩී. තිලිණි මධුෂානි සිරිවර්ධන මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-20.3 802ඩී යටදොලවත්ත නැගෙනහිර ග්‍රාම සේවක වසමට අයත් ඉද්දමල්වත්ත ගම්මානයට ඇතුළු වන ප්‍රධාන මාර්ගය ආරම්යේ සිට තුන්මං හන්දිය දක්වා මාර්ගය කොටස අලුත්වැඩියා කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.කේ. කාවින්දයා ඉඳුවරනි මෙනවිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.ඒ.ඩී. තිලිණි මධුෂානි සිරිවර්ධන මහත්මියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රුවන්ති වාසනා මහත්මිය**

මෙම පටුමගවල් සියල්ලෙම ප්‍රශ්න තියෙනවා කාණුපද්ධතියක් නැහැ. වැසිදින වලදි වතුර ගලා යන්නේ පාර හරහා. එතන බෝක්කුව දාලා තියෙන්නේ තනි බෝක්කුවකින් එය ගලවලා සුද්ද කරන්නත් බැහැ. ඒ සියල්ල ආවරණය වන පරිදි කටයුතු කරන්න පුළුවන් නම් හොඳයි යන්න මගේ මතය යැයි අදහස් දක්වන ලදි

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඒ සියළුම ගෙවල් අනුමැතියකින් තොරව හදපු ඒවා යැයි වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ඊ-21 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-21.1 794බී නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ ඇති මල්වතුකන්ද පාරේ ආරම්භක ස්ථානයේ ඇති කාණු පද්ධතිය සංවර්ධනයට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාවතගේ ගාමිණී සිසිර කුලරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කරමින් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොන් සීමන් රාලලාගේ දුමිඳු චතුර සම්පත් මහතා මහතා**

එම ස්ථානය පොඩි වැස්සකට පවා යටවෙනවා මේ සම්බන්ධයෙන් කුමක් හෝ ක්‍රියාමාර්ගයක් ගන්න යැයි අදහස් දක්වන ලදී.

**ඊ-22 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාමිණී කුලරත්න මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-22.1 හොරවල හන්දිය සිට මාවතගොඩ දක්වා දිවෙන මාර්ගයේ වෙළ මැද මුල් කොටස එක් පැත්තක් අඩි 03 බැගින් අඩි 06ක් පුළුල් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාමිණී කුලරත්න මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-22.2 කටුවාලගොඩ මාර්ගයේ හෂාන් කෙවිටියාගල මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ කොටස වතුර බැසයාම නිසා වෙළට සේදී ගොස් ඇත. එම නිසා මාර්ගය පටු වී ඇ.් එය කළුගල් බැම්මක් මගින් ආවරණයට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාමිණී කුලරත්න මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-22.3 රණවිජයගම (හොලින්බෝන් වත්ත) ගම්මානයේ ජල හිඟය නිසා පිඩ විදින ජනතාවට ළිං ජලය ලබාදිමට ළිඳක් සැකසිමට යෝජනා කරමි. නැතහොත් ප්‍රධාන මාර්ගයෙන් යන ජල නල පද්ධතියෙන් ජලය ලබා ගැනිමට ජල සම්පාදන මණ්ඩලයට යෝජනා කිරිමට කටයුතු කරන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාමිණී කුලරත්න මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාමිණී කුලරත්න මහතා**

ඉහත යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කරමින් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා**

හොරවල මාවතගොඩ මාර්ගය අඩි 20ක සභාවේ අනුමත මාර්ගයක් සංවර්ධනය කර දෙන ලෙස අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

හොලින්බෝන් ජනපදයේ තියෙනවා ලිටර් 5000ක් ටැංකියක් මේ පැවිල්ල දවස වල මම ඉල්ලා සිටිනවා සභාව මගින් ඒ ජල ටැංකියට ජලය ලබා දී ඒ අවශ්‍යතාවය සපුරන්න කියලා. දැනට ප්‍රජා ව්‍යාපෘතියක් මගින් කරගෙන යන්නේ. මේ සඳහා සභාව දෙන්න පුළුවන් දායකත්වය දෙන්න පුළුවන් නම් වඩා හොඳයි. ඒ මන්ත්‍රීතුමාගේ යෝජනාව සබාවට පවරා ගන්න තමයි අදහස. ඒ පිළිබඳ අවධානය යොමුකරන්න යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

නිලධාරින් එක්ක සාකච්ඡා කරලා ළිඳ පවරගන්න පුළුවන් නම් ඒ පිළිබඳව දැනුවත් කරන්නම් යැයි අදහස් දක්වන ලදි.

- **හදිසි යෝජනා**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා**

1 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 2.5 විධිවිධාන ප්‍රකාර (2025 සිට ක්‍රියාත්මක) මතුගම ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා භාර ගැනිමේ කමිටුව සඳහා වන පහත සඳහන් සාමාජිකයින්ගෙන් යුක්ත **භාර ගැනිමේ කමිටුව** පත් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

| | | | |
|---|---|---|---|
| සභාපති | - | කසුන් මුණසිංහ මහතා | - සභාපති, මතුගම ප්‍රාදේශීය සභාව |
| සාමාජික | - | ඩී.එම්.එන්.එන්. දසනායක මිය | - වැඩ අධිකාරි |
| සාමාජික | - | ඒ.ජී.ඩී. ඉන්දිකා මිය | - අභ්‍යන්තර විගණන නිලධාරි |
| සාමාජික | - | ජී.ඒ. ශ්‍යාමලි මධුවන්ති මිය | - සංවර්ධන නිලධාරි |

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

2 **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජෙ එරංග කරවිට මහතා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා**

2025 කඨින පුජෝත්සවය නිමිතිකොටගෙන මතුගම සභා බල ප්‍රෙද්ශය තුළ මංමාවත් පිරිසිදු කොට විදුලිපහන් අළුත්වැඩියා කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජෙ එරංග කරවිට මහතා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කරමින් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

කඨින පිංගම වලට අවශ ඒ මාර්ග මේ වන විට පිලිසකර කරමින් පවතිනවා. ඒ අවශ්‍ය කරන විදි ලාම්පු සවිකර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන බව අදහස් දක්වන ලදී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජෙ එරංග කරවිට මහතාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

3 **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා**

පාන්තිය වතුකරයේ ජනතාවට ජලය නැතිව දැඩි පීඩාවකට ලක් වෙලා ඉන්නවා. ඒ ජනතාවගේ එකම බලාපොරොත්තුව ජලය ලබා ගැනිම. ඒ සඳහා අවධානය යොමු කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොන් සීමන් රාලලාගේ දුමිඳු චතුර සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොන් සීමන් රාලලාගේ දුමිඳු චතුර සම්පත් මහතා**

මේ සම්බන්ධව වෝටර් බෝඩ් එකත් එක්ක කතා කරලා ජලය පහලට තියෙනවා ඉහලට තමයි නැත්තේ යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ කාරණාව සම්බන්ධයෙන් සම්බන්ධිකරණ කමිටුවලයි දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවලයි සාකච්ඡා වන කාරණාවක් නැවතත් මේ සම්බන්ධව සම්බන්ධිකරණ කමිටුවටයි දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවටයි ඉදිරිපත් කරලා සාකච්ඡා කරලා තිරණයක් ගමු යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොන් සීමන් රාලලාගේ දුමිඳු චතුර සම්පත් මහතා**

සභාපතිතුමනි මෙය පාස් වෙච්ච ව්‍යාපෘතියක් අනුප පැස්කුවල් ඇමතිතුමාගේ කාලේ ඔය ව්‍යාපෘතිය දුන්නා ඒ සඳහා ලක්ෂ 20ක් පාස් වුණා. එතනින් උඩට සල්ලි පාස් වෙලා තිබුණේ ඔබතුමා මේ පිළිබඳව සොයා බලන්න යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතා**

මෙම ස්ථානයේ ළිඳක් තියෙනවා ඒ ළිඳෙන් හැමෝටම වතුර දෙන්න පුළුන් එම ස්ථානයට තාක්ෂණ නිලධාරින් යවලා ස්ථාන පරික්ෂණයක් කරලා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මෙනවියගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

(උ) කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරිම - අමුණා ඇත

- 2025.08.06 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා ඉදිරිපත් කිරිම (ඇමුණුම 1)
- 2025.08.29 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා ඉදිරිපත් කිරිම (ඇමුණුම 2)
- 2025.08.06 වන දින ප්‍රසම්පාදන කාරක සභා වාර්තා (ඇමුණුම 3)
- 2025.08.15 වන දින ප්‍රසම්පාදන කාරක සභා වාර්තා (ඇමුණුම 4)

(ඌ) සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරිම

- 2025 ජූලි මස ආදායම් වාර්තා ව ඉදිරිපත් කිරිම (ඇමුණුම 5)
- 2025 ජූලි මස වියදම් වාර්තා ව ඉදිරිපත් කිරිම (ඇමුණුම 6)

(ඒ) න්‍යාප පත්‍රයට ඇතුලත් විය යුතු කරුණු

  - සභික අදහස් දැක්විම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරව්ල සමිතවංශ හිමි**

ගරු සභාපතිතුමනි, සභාවේ නිලධාරින් සේවකයින් ඉල්ලිමක් කරනවා සිනි දාලා තේ එකක් දෙන්න කියලා. මේ පිළිබඳව සලකා බලා අවශ්‍ය කටයුතු සලසා දෙන්න යැයි ප්‍රකාශ කර සිටිනවා.

මෙරිල් සභාපතිතුමා ඉන්න කාලෙත් ක්‍රියාත්මක කලා සියළු කමිටු පිහිටවලා තියෙනවානේ ඔබතුමා පෙත්සම් කමිටුවක් මෙකේ ස්ථාපිත කරන්න. මෙකේ ගොඩාක් අය ඉන්නවා මිනිසුන්ට දැවෙන ප්‍රශ්න කියාගන්න තැනක් නැතුව. යම්කිසි නිලධාරියෙක් සේවකයෙක් මාත් එක්ක කතා කලොත් ඒ නිලධාරියා එදාට වෙන තැනකට මාරුකරනවා.

මන්ත්‍රීවරුන්ට කේලාම් කියනවා කියලා. මම යෝජනා කරනවා අදහස් යෝජනා ඉදිරිපත කරන්න පෙට්ටියක් තියන්න (කැමරාවක් නැති තැනක).

ගිය අවුරුද්දේ ස්ථිර කරපු අය දහමාසේ ලෝන් එක ඉල්ලනවා . ඒ අය සඳහා එම ලෝන් එක ලබා දිමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

අළුතෙන් ස්ථිර වුණ අයට ගිය අවුරුද්දේ නිල ඇඳුම දිලා නැහැ. ගිය අවුරුද්දේ නිල ඇඳුම් මේ අවුරුද්දේ දිලා තියෙන්නේ. මේ අවුරුද්දේ තවමත් දිලා නැහැ. ඒ ගැන සොයා බලා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

අපි මේ කතා කරන දේවල් වලට පිළිතුරක් දෙන්න. ඔබතුමා ලේකම්තුමිය ආරක්ෂා කරන්න යන්න එපා. වැරදි තියෙනවා නම් සභාව දැනුවත් කරන්න. ඔබතුමා මේ සම්බන්ධව තීන්දු තිරණ ගන්නේ නැත්නම් මම ස්වාධිනව එහා පැත්තේ පුටුවේ වාඩි ගන්නවා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

හිටපු අමාත්‍ය කුමාර වෙල්ගම මැතිතුමන් අභාවප්‍රාප්ත වෙලා සැප්තැම්බර් මස 27 වන දින වසරක් සම්පූර්ණ විම නිමිත්තෙන් පිරිත් පිංකමක් තියෙනවා 27 රාත්‍රියේ 28 උදේ දානමය පිංකම සඳහා සභාවේ සභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රී මණ්ඩලයට ආරාධනා කරන්න කියලා එතුමාගේ කාර්ය මණ්ඩලයේ ලේකම්තුමා විසින් දැන්වූවා,

පෙර පාසල් පාලිකාවන් සඳහා අවසර ලබා දෙන්න කියලා පෙර පාසල් ඉවර වෙලා නිවෙස් කරා යාම සඳහා, තවමත් පෙර පාසල් සහායක තනතුර ලබපු පාලිකාවන් සඳහා ඒ අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලිමක් කර සිටිනවා.

මේ මාසේ පවත්වපු සම්බන්ධිකරණ කමිටුවේ දි මගේ නම් භාවිතා කරලා ප්‍රකාශයක් ඉදිරිපත් කරලා තියෙනවා මගේ කොට්ඨාසය නියෝජනය කරන සම්පත් මන්ත්‍රීතුමා විසින්. දෙබරබැදි හේන ග්‍රාමයට වතුර නැති ප්‍රශ්නය සම්බන්ධයෙන් වතුර මෝටරය රුවන්දි මන්ත්‍රීතුමිය ගලවන් ගිහින් කියලා. ඊළඟ සම්බන්ධිකරණ කමිටුවේදී මේ චෝදනාව නිවැරදි කළයුතු බව වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ජුනි මස 30 වන දා මේ සභාව යන්නේ ඒ මාසයට අදාල මන්ත්‍රී දිමනාවක් තියෙනවා ඒක අපිට තවම ලැබිලා නැහැ. ඒ පිළිබඳව ගත් තිරණයක් තියෙනවද. ඒ සම්බන්ධ ලිපි තියෙනවා නම් ඒවා සභාවට ලිපි ඉදිරිපත් කිරිම යටතේ ඉදිරිපත්කරන ලෙස අදහස් දක්වන ලදී.

අපි සභාවට ඉදිරිපත් කරන යෝජනා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අප දැනුවත් කරන මෙන් අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

අපි මතුගම ප්‍රාදේශීය සභාව ලෙස කටයුතු කරද්දි මම ඉල්ලිමක් කරනවා සියලුදෙනාගෙන් අපි මෙතනට ඇවිල්ලා තියෙන්නේ විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරමින් ප්‍රතිපත්තිමය කාරණා මත යම් දේශපාලනයකට අවතිර්ණ වෙන්න පුළුවන් නම් මම හිතනවා මතුගම සභාව විසින් එකින්නෙකා අතර ලේ කෝපවීම් නැතුව, මේ සභාවේ වැඩ කරන නිලධාරින්ටත් සභාපතිතුමාටත් පුළුවන්කම තියෙනවා අර ලස්සන මතුගම කියන සංකල්පයට අනුව කටයුතු කරන්න.

අපි යෝජනා සම්මත කරගෙන අපි 33දෙනාගේ යෝජනා තමයි සභාව තුළ ක්‍රියාත්මක වෙන්නේ කියලා මේ මතුගම ප්‍රාද්ශයේ ජනතාවට අපි සන්නිවේදනය කරමු. ඒ සන්නිවේදනය සඳහා අපි ඒ වෙනුවෙන් ඕනම සහයෝගයක් දක්වනවා යැයි අදහස් දක්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමන් ප්‍රසාද් මහතා**

සගීත් මන්ත්‍රීතුමාගේ ඉල්ලිම පරිදි ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන අගෝස්තු මාසයේ 17වනදා අළුත්ගමගොඩ ප්‍රදේශයේ පැවැත්වෙලා තියෙනවා ඒ සඳහා මතුගම ප්‍රාදේශීය සභාවේ පූර්ණ සහයෝගය ලබා දී තිබෙනවා. ඒ වෙනුවෙන් ස්තූතිය ප්‍රකාශ කරන ලෙස සගීත් මන්ත්‍රීතුමා විසින් මා වෙත පවසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

වෙළඳ සංකිර්ණයක් ඉදිරිකිරිම සඳහා සුදර්ශන මාවතේ කෙනෙක් ඉඩමක් දීලා තියෙනවා. ඒ ඉඩම සඳහා ගිය සභාවේ දීත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය දේවල් සම්මත කර ගන්නා ලද අතර, පසුගිය සභාවාරයකදී සභාපතිතුමා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළද දැන් මේ සම්බන්ධයෙන් පවතින තත්ත්වය මොකක්ද යන්න දැනගන්න කැමති බව අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ACLG ඔෆිස් එකෙන් ඇස්තමේන්තුවක් ඉල්ලලා තියෙනවා පස් වලට යන ප්‍රමාණය, පස්වලට යන ප්‍රමාණය ඇස්තමේන්තුවක් ඉල්ලන්න කලින් අපිට ගොඩකරන්න අවසරය දෙන්න එපැයි ගොවිජන එකෙන්. ඒ නිසා මුලින්ම ගොඩ කරන්න අවසරය ලබා ගැනිමට ඉල්ලිමක් කරන්න. ඊට පස්සේ අපිට සල්ලි දෙනවද නැද්ද කියන එක තීරණය කරන්න. අපිට කරන්න පුළුවන් නම් ඉදිරියට කරනවා වැඩ පිළිවෙල යන්න අදහස් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

අපිට මේ සභාව කාරක සභාවක් බවට පත්කර ගැනිමට හැකියාවක් තියෙනවා. ලේකම්තුමියට මයික් එකකකුත් තියෙනවා. නමුත් එතුමියට අදහස් දැක්විමට අවස්ථාවක් දෙන්න වෙන්නේ නැහැ. එතුමිය හැමතිස්සේම අපහසුතාවයට පත්වෙනවා. ඒ නිසා මම හිතනවා සමහරවිට කාරක සභාවක් බවට තිරණය කරලා එතුමියට ඒ අවස්ථාව ලබාදෙමු යැයි අදහස් දක්වන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

ඉඩම් හිමියන් විසින් ඔවුන්ගෙ ඉඩමෙන් 3/2ක් ඔවුන්ටත් 1/3 සභාවට ලෙස අපි ගිවිසුම් අත්සන් කරා ඉඩම් හිමියන් සමඟ. ඊට පසුව ගොවිජන දෙපාර්තමේන්තුව මගින් අවසරය ගත්තා ඉඩම ගොඩකරන්න. මම කියන්නේ එතන ඉඳලා ඉදිරියට යන්න කියලා පර් 100කට වඩා ගොඩ කිරිමට අවසරය ලැබිලා තියෙන්නේ ඒ නිසා ඉදිරි කටයුතු කිරිම නවත්තපු තැන ඉඳලා ඉදිරියට යන්න කාලය දීර්ඝ කිරිමට අවසරය ලබාගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාල් රංජිත් සිල්වා මහතා**

සහික ලෙස රාජකාරි හැඳුනුම්පත ලබා දෙන්නේ නම් එම හැඳුනුම්පත අවශ්‍ය නොවන බව අදහස් කරන ලදී.

**න්‍යාය පත්‍රානුකූලව මෙදින නියමිත කටයුතු අවසන් විමෙන් පසුව මහ සභාවේ කටයුතු ප.ව. 4.45ට පමණ අවසන් විය.**

කසුන් මුණසිංහ.
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.